අ.පො.ස. (සා.පෙළ) විභාගය

# ඇගයීම් වාර්තාව
# 2024

## 33 ඉතිහාසය

පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස (සා.පෙළ) විභාගය - 2024

## ඇගයීම් වාර්තාව

## 33 - ඉතිහාසය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි**

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2024**

**ඇගයීම් වාර්තාව - ඉතිහාසය**

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ඒ.කේ.එස් .ඉන්දිකා කුමාරි ලියනගේ<br>විභාග කොමසාරිස් ජනරාල් |
| සැලසුම හා සංවිධානය | : | ඩබ්.එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| විෂය සම්බන්ධීකරණය | : | විපුලසිරි හේරත්<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පාසල් විභාග හා සංවිධාන |
| අන්තර්ගත සංවර්ධනය සඳහා | | |
| විෂය පාදක මග පෙන්වීම | : | සම්මානිත මහාචාර්ය යූ.බී. කරුණානන්ද |
| ශාස්ත්‍රීය මඟ පෙන්වීම | : | ඩබ්.එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| අන්තර්ගත සංවර්ධන කමිටුව | : | විපුලසිරි හේරත්<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පාසල් විභාග හා සංවිධාන<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| | : | එල්. ආර්. ආර්. සිල්වා<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>(ජාතික භාෂා හා මනාව ශාස්ත්‍ර ශාඛාව ) |
| | : | පී.ඒ.වී. මාලි ප්‍රියදර්ශනී<br>ශ්‍රී.ලං.ගු.සේ<br>ර/උඩගම මහා විද්‍යාලය,<br>පින්නවල, බලංගොඩ |
| | : | එච්. එම්. එන්.ඒ. බණ්ඩාර<br>ශ්‍රී. ලං. ගු. සේ<br>ර/ කුරුවිට ජාතික පාසල<br>කුරුවිට |

: ජී. එම්. පී. කිර්ති නිශාන්ත කුමාර
ශ්‍රී. ලං. ගු. සේ
ර/ ධර්මාලෝක මහා විද්‍යාලය
පැල්මඩුල්ල

: කේ.ජී.එස්. කුමාර
ශ්‍රී.ලං.ගු.සේ
ර/එරත්න මහා විද්‍යාලය,
එරත්න, කුරුවිට
රත්නපුර

ලේඛන සහාය : ඩී. පී. එම්. සමන්තිලක
කළමනාකරණ සේවා නිලධාරී

පරිගණක පිටපත් සැකසුම : ජේ.කේ. එච්. නවෝදනි ජයනෙත්ති
දත්ත සටහන් ක්‍රියාකරු

පිටකවර සැකසුම : ඒ. එල්. කේ. චතුරාණි
කළමනාකරණ සේවා නිලධාරි

## විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ 2024 වර්ෂයේ ඉතිහාසය විෂයයට අදාළව මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කර ඇත්තේ අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ දත්තමය හා විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දීම, ඔවුන්ගේ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීම සහ එම අනාවරණයන් පදනම් කරගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණ පෙරදැරිව ය.

මෙම වාර්තාවේ, විෂය නිර්දේශයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා හා ඉගෙනුම් ඵල අනුව අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත. ඒ අනුව එක් එක් පරීක්ෂණ අයිතමය සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර, ශක්තීන් හා දුර්වලතා මෙන් ම වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ සඳහා සුදුසු අධ්‍යාපන යෝජනා ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව ගුරුවරුන්, පාසල් පරිපාලකයන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන්, සිසුන් සහ දෙමාපියන් ඇතුළු අධ්‍යාපන පද්ධතියේ සියලු ම පාර්ශ්වකරුවන් සඳහා වැදගත් ලේඛනයකි. වාර්තාවේ අන්තර්ගත, විශ්ලේෂණ මඟින් ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා නිවැරදිව හඳුනාගෙන ඉලක්කගත ඉගැන්වීම් ක්‍රමෝපායන් සැලසුම් කිරීමට හැකි වන අතර, සිසුන්ට තම ඉගෙනුම් අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සූදානම් වීමට මඟ පෙන්වයි. එමෙන් ම විෂයමාලා සංශෝධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, සම්පත් වෙන් කිරීම සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ද මෙම වාර්තාව ඉවහල් වනු ඇත.

මෙම වාර්තාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා, අපේක්ෂකයන්ගේ සාධන දත්ත සමඟ එක් එක් පරීක්ෂණ අයිතමයට අදාළ විශ්ලේෂණ, නිරීක්ෂණ සහ නිර්දේශ ඒකාබද්ධව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමඟින් සිසුන් මුහුණ දෙන සංකල්පමය දුර්වලතා සහ ඉගෙනුම් අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා සුදුසු මැදිහත්වීම් සැලසුම් කළ හැකි වනු ඇත. තවද, මෙම වාර්තාව ඉදිරි වසරවල අපේක්ෂකයන්ගේ සාධනය සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පදනමක් ලෙස ද භාවිත කළ හැකිය.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දත්ත මත පදනම් වූ තීරණ ගැනීම අත්‍යවශ්‍ය වන බැවින්, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති අනාවරණයන් සහ නිර්දේශ ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ගුරුවරුන් සහ සිසුන් විසින් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට දායක කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කිරීම සඳහා කැපවීමෙන් දායක වූ සියලු ම සම්පත්දායකයන්ට සහ විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන්ට මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි. විශේෂයෙන් ම විද්‍යාත්මක ප්‍රවේශයකින් මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා ඔවුන් දැක්වූ වෘත්තීමය දායකත්වය ඉතා අගය කොට සලකමි.

ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ

විභාග කොමසාරිස් ජනරාල්

## සංක්ෂිප්තය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ 2024 වර්ෂයේ ඉතිහාසය විෂයයට අදාළව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මෙම ඇගයීම් වාර්තාව, අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ප්‍රකාශනයකි. මෙම වාර්තාව ගුරුවරුන්, විෂයභාර නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පර්යේෂකයන්, සිසුන් සහ දෙමාපියන් සඳහා ප්‍රයෝජනවත් ලේඛනයක් ලෙස භාවිත කළ හැකි ය.

මෙම වාර්තාව ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

**පළමු කොටසෙහි**, ඉතිහාසය විෂය අරමුණු සහ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු, මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව අපේක්ෂක සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අනුව සාධනය සහ අනෙකුත් සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

**දෙවන කොටසෙහි**, I පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි I පත්‍රයේ ව්‍යූහය, I පත්‍රය, ලකුණු ලබාදීමේ පටිපාටිය සහ අයිතමවල පහසුතා දර්ශක, තෝරාගත් ප්‍රශ්න සඳහා විශ්ලේෂණය සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ද ඉදිරිපත් කර ඇත.

**තෙවන කොටසෙහි**, II පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුර, අයිතමවල පහසුතා දර්ශක, එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර, එම අනාවරණයන් මත පදනම්ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස සංවිධානය කිරීම සඳහා සංවර්ධනාත්මක යෝජනා ද ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව සකස් කිරීම සඳහා සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory - CTT) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory - IRT) යන විද්‍යාත්මක ප්‍රවේශයන් යොදාගෙන අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කර ලබාගත් දත්ත භාවිත කර ඇත. මීට අමතරව පිළිතුරු පත්‍ර ඇගයීමේ කටයුතුවල නිරත වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන් සහ සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ද මෙම වාර්තාව සකස් කිරීම සඳහා පාදක කරගෙන ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් විශ්ලේෂණයන් සහ නිර්දේශ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විෂය සාධනය ඉහළ නැංවීම, විෂයමාලා සංවර්ධනය සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

## පටුන

1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු 01
1.1 විෂය අරමුණු 01
1.2 අපේක්ෂකයන්ගේ විෂයය සාධනය පිළිබඳ තොරතුරු 02
1.2.1 ඉතිහාසය විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 02
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 02
1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 03
1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය අධ්‍යාපන කලාප අනුව 04
1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය 07
2. ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු - I පත්‍රය 08
2.1 ඉතිහාසය I පත්‍රයේ ව්‍යුහය 08
2.2 ඉතිහාසය I පත්‍රය 09
2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය 13
2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය 14
2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 15
2.6 I පත්‍රයේ විශ්ලේෂණය 16
2.7.1 නිපුණතා අනුව පහසුතා දර්ශකය 17
2.8 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ , නිගමන හා යෝජනා 18
3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය 20
3.1 ඉතිහාසය II පත්‍රයේ ව්‍යුහය 20
3.2 II පත්‍රයේ විශ්ලේෂණය 21
3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ 24
3.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර 24
3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය 28
3.3.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර 30
3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය 31
3.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර 33
3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය 34
3.3.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර 36
3.3.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය 37

3.3. 9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර 39
3.3.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය 41
3.3.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර 43
3.3.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය 45
3.3.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර 47
3.3.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය 48
3.3.15 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර 50
3.3.16 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය 52
3.3.17 ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර 54
3.3.18 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය 55

## වගු නාමාවලිය

වගුව 1.1 මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 02

වගුව 1.2 ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 02

වගුව 1.3 දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 03

වගුව 1.4 අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 04

වගුව 1.5 පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය 07

වගුව 2.1 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය 13

වගුව 2.2 එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 14

## ප්‍රස්තාර නාමාවලිය

ප්‍රස්තාරය 2.1 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 15

ප්‍රස්තාරය 2.2 II පත්‍රයේ විෂය නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශකය 17

ප්‍රස්තාරය 3.1 II පත්‍රයේ එක් එක් ප්‍රශ්නවල පහසුතාව හා ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 21

ප්‍රස්තාරය 3.2 II පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය 22

ප්‍රස්තාරය 3.3 පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය 22

ප්‍රස්තාරය 3.4 ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 28

ප්‍රස්තාරය 3.5 ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශක 28

ප්‍රස්තාරය 3.6 ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 31

ප්‍රස්තාරය 3.7 ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශක 31

ප්‍රස්තාරය 3.8 ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 34

ප්‍රස්තාරය 3.9 ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශක 34

ප්‍රස්තාරය 3.10 ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 37

ප්‍රස්තාරය 3.11 ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශක 37

ප්‍රස්තාරය 3.12 ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 41

ප්‍රස්තාරය 3.13 ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශක 41

ප්‍රස්තාරය 3.14 ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 45

ප්‍රස්තාරය 3.15 ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශක 45

ප්‍රස්තාරය 3.16 ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 48

ප්‍රස්තාරය 3.17 ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශක 48

ප්‍රස්තාරය 3.18 ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 52

ප්‍රස්තාරය 3.19 ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශක 52

ප්‍රස්තාරය 3.20 ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 55

ප්‍රස්තාරය 3.21 ප්‍රශ්න අංක 9 සඳහා පහසුතා දර්ශක 55

# I කොටස

## 1.0 විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අරමුණු

- ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම.
- අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මගින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම.
- ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමය සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම.
- ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
- කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම.
- වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම.
- ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම.
- කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.
- ඓතිහාසික තොරතුරු ස්ථාන හඳුනාගැනීම.

මූලාශ්‍රය : 11 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය - ඉතිහාසය (2016), ජා.අ.අ

## 1.2 අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1 ඉතිහාසය විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

### වගුව 1.1

මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| මාධ්‍යය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| සිංහල | 127,418 | 49.78 | 128,546 | 50.22 | 255,964 | 2,060 | 53.26 | 1,808 | 46.74 | 3,868 | 129,478 | 49.83 | 130,354 | 50.17 | 259,832 |
| දෙමළ | 34,609 | 47.89 | 37,655 | 52.11 | 72,264 | 3,026 | 58.24 | 2,170 | 41.76 | 5,196 | 37,635 | 48.59 | 39,825 | 51.41 | 77,460 |
| ඉංග්‍රීසි | 691 | 64.70 | 377 | 35.30 | 1,068 | 3,390 | 50.36 | 3,342 | 49.64 | 6,732 | 4,081 | 52.32 | 3,719 | 47.68 | 7,800 |
| එකතුව | **162,718** | **49.41** | **166,578** | **50.59** | **329,296** | **8,476** | **53.66** | **7,320** | **46.34** | **15,796** | **171,194** | **49.61** | **173,898** | **50.39** | **345,092** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

### වගුව 1.2

ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| **A** | 31,635 | 19.44 | 46,778 | 28.08 | 78,413 | 658 | 7.76 | 939 | 12.83 | 1,597 | 32,293 | 18.86 | 47,717 | 27.44 | 80,010 |
| **B** | 17,604 | 10.82 | 21,716 | 13.04 | 39,320 | 463 | 5.46 | 574 | 7.84 | 1,037 | 18,067 | 10.55 | 22,290 | 12.82 | 40,357 |
| **C** | 38,176 | 23.46 | 37,200 | 22.33 | 75,376 | 1,196 | 14.11 | 1,184 | 16.17 | 2,380 | 39,372 | 23.00 | 38,384 | 22.07 | 77,756 |
| **S** | 41,410 | 25.45 | 34,030 | 20.43 | 75,440 | 1,922 | 22.68 | 1,563 | 21.35 | 3,485 | 43,332 | 25.31 | 35,593 | 20.47 | 78,925 |
| **W** | 33,893 | 20.83 | 26,854 | 16.12 | 60,747 | 4,237 | 49.99 | 3,060 | 41.80 | 7,297 | 38,130 | 22.27 | 29,914 | 17.20 | 68,044 |
| එකතුව | **162,718** | **100.00** | **166,578** | **100.00** | **329,296** | **8,476** | **100.00** | **7,320** | **100.00** | **15,796** | **171,194** | **100.00** | **173,898** | **100.00** | **345,092** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත , 2024, ශ්‍රී.ලං.වි.දෙ.

### 1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

**වගුව 1.3**

දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්ක | පෙනී සිටි සංඛ්‍යාව | ඉතිහාසය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | විශිෂ්ට සම්මාන (A) | | අධි සම්මාන (B) | | සම්මාන (C) | | සාමාන්‍ය (S) | | සමත් (A+B+C+S) | | අසමත් (W) | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 33,640 | 11,165 | 33.19 | 4,171 | 12.40 | 6,814 | 20.26 | 6,053 | 17.99 | 28,203 | 83.84 | 5,437 | 16.16 |
| ගම්පහ | 30,285 | 7,648 | 25.25 | 3,711 | 12.25 | 6,640 | 21.93 | 6,651 | 21.96 | 24,650 | 81.39 | 5,635 | 18.61 |
| කළුතර | 18,441 | 4,814 | 26.10 | 2,245 | 12.17 | 3,906 | 21.18 | 4,045 | 21.93 | 15,010 | 81.39 | 3,431 | 18.61 |
| මහනුවර | 23,117 | 5,469 | 23.66 | 2,793 | 12.08 | 5,692 | 24.62 | 5,486 | 23.73 | 19,440 | 84.09 | 3,677 | 15.91 |
| මාතලේ | 8,449 | 1,577 | 18.66 | 998 | 11.81 | 2,182 | 25.83 | 2,182 | 25.83 | 6,939 | 82.13 | 1,510 | 17.87 |
| නුවරඑළිය | 11,662 | 1,703 | 14.60 | 1,248 | 10.70 | 2,894 | 24.82 | 3,221 | 27.62 | 9,066 | 77.74 | 2,596 | 22.26 |
| ගාල්ල | 17,764 | 4,691 | 26.41 | 2,221 | 12.50 | 3,996 | 22.49 | 3,846 | 21.65 | 14,754 | 83.06 | 3,010 | 16.94 |
| මාතර | 13,618 | 3,801 | 27.91 | 1,810 | 13.29 | 3,244 | 23.82 | 2,821 | 20.72 | 11,676 | 85.74 | 1,942 | 14.26 |
| හම්බන්තොට | 11,083 | 2,624 | 23.68 | 1,500 | 13.53 | 2,830 | 25.53 | 2,441 | 22.02 | 9,395 | 84.77 | 1,688 | 15.23 |
| යාපනය | 7,999 | 2,084 | 26.05 | 766 | 9.58 | 1,262 | 15.78 | 1,527 | 19.09 | 5,639 | 70.50 | 2,360 | 29.50 |
| මන්නාරම | 1,822 | 293 | 16.08 | 157 | 8.62 | 357 | 19.59 | 435 | 23.87 | 1,242 | 68.17 | 580 | 31.83 |
| වවුනියාව | 2,687 | 490 | 18.24 | 228 | 8.49 | 499 | 18.57 | 654 | 24.34 | 1,871 | 69.63 | 816 | 30.37 |
| මුලතිව් | 2,016 | 393 | 19.49 | 203 | 10.07 | 389 | 19.30 | 435 | 21.58 | 1,420 | 70.44 | 596 | 29.56 |
| කිලිනොච්චි | 2,566 | 543 | 21.16 | 291 | 11.34 | 515 | 20.07 | 552 | 21.51 | 1,901 | 74.08 | 665 | 25.92 |
| මඩකලපුව | 8,365 | 1,927 | 23.04 | 924 | 11.05 | 1,817 | 21.72 | 2,034 | 24.32 | 6,702 | 80.12 | 1,663 | 19.88 |
| අම්පාර | 11,698 | 2,657 | 22.71 | 1,491 | 12.75 | 2,870 | 24.53 | 2,963 | 25.33 | 9,981 | 85.32 | 1,717 | 14.68 |
| ත්‍රිකුණාමලය | 6,835 | 1,183 | 17.31 | 630 | 9.22 | 1,390 | 20.34 | 1,729 | 25.30 | 4,932 | 72.16 | 1,903 | 27.84 |
| කුරුණෑගල | 27,699 | 6,647 | 24.00 | 3,388 | 12.23 | 6,768 | 24.43 | 6,460 | 23.32 | 23,263 | 83.98 | 4,436 | 16.02 |
| පුත්තලම | 12,269 | 2,198 | 17.92 | 1,247 | 10.16 | 2,666 | 21.73 | 3,161 | 25.76 | 9,272 | 75.57 | 2,997 | 24.43 |
| අනුරාධපුරය | 16,780 | 3,403 | 20.28 | 1,945 | 11.59 | 4,268 | 25.44 | 4,136 | 24.65 | 13,752 | 81.95 | 3,028 | 18.05 |
| පොළොන්නරුව | 7,010 | 1,271 | 18.13 | 733 | 10.46 | 1,563 | 22.30 | 1,859 | 26.52 | 5,426 | 77.40 | 1,584 | 22.60 |
| බදුල්ල | 13,781 | 3,012 | 21.86 | 1,716 | 12.45 | 3,310 | 24.02 | 3,350 | 24.31 | 11,388 | 82.64 | 2,393 | 17.36 |
| මොණරාගල | 8,552 | 1,602 | 18.73 | 1,007 | 11.78 | 2,172 | 25.40 | 2,222 | 25.98 | 7,003 | 81.89 | 1,549 | 18.11 |
| රත්නපුරය | 17,963 | 4,385 | 24.41 | 2,258 | 12.57 | 4,114 | 22.90 | 4,067 | 22.64 | 14,824 | 82.53 | 3,139 | 17.47 |
| කෑගල්ල | 13,195 | 2,833 | 21.47 | 1,639 | 12.42 | 3,218 | 24.39 | 3,110 | 23.57 | 10,800 | 81.85 | 2,395 | 18.15 |
| **එකතුව** | **329,296** | **78,413** | **23.81** | **39,320** | **11.94** | **75,376** | **22.89** | **75,440** | **22.91** | **268,549** | **81.55** | **60,747** | **18.45** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

## 1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය අධ්‍යාපන කලාප අනුව

## වගුව 1.4

අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| අධ්‍යාපන කලාප | පෙනී සිටි සංඛ්‍යාව | ඉතිහාසය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | B | | C | | S | | A+B+C+S | | W | |
| | | සංඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % |
| කොළඹ | 14,483 | 5,639 | 38.94 | 1,733 | 11.97 | 2,541 | 17.54 | 2,269 | 15.67 | 12,182 | 84.11 | 2,301 | 15.89 |
| හෝමාගම | 5,604 | 1,644 | 29.34 | 655 | 11.69 | 1,148 | 20.49 | 1,122 | 20.02 | 4,569 | 81.53 | 1,035 | 18.47 |
| ශ්‍රී ජයවර්ධනපුර | 7,918 | 2,310 | 29.17 | 992 | 12.53 | 1,768 | 22.33 | 1,568 | 19.80 | 6,638 | 83.83 | 1,280 | 16.17 |
| පිළියන්දල | 5,635 | 1,572 | 27.90 | 791 | 14.04 | 1,357 | 24.08 | 1,094 | 19.41 | 4,814 | 85.43 | 821 | 14.57 |
| ගම්පහ | 8,936 | 3,102 | 34.71 | 1,097 | 12.28 | 1,793 | 20.06 | 1,695 | 18.97 | 7,687 | 86.02 | 1,249 | 13.98 |
| මිනුවන්ගොඩ | 6,000 | 1,527 | 25.45 | 788 | 13.13 | 1,413 | 23.55 | 1,344 | 22.40 | 5,072 | 84.53 | 928 | 15.47 |
| මීගමුව | 7,557 | 1,320 | 17.47 | 885 | 11.71 | 1,739 | 23.01 | 1,845 | 24.41 | 5,789 | 76.60 | 1,768 | 23.40 |
| කැළණිය | 7,792 | 1,699 | 21.80 | 941 | 12.08 | 1,695 | 21.75 | 1,767 | 22.68 | 6,102 | 78.31 | 1,690 | 21.69 |
| කළුතර | 9,091 | 2,244 | 24.68 | 1,068 | 11.75 | 1,911 | 21.02 | 2,140 | 23.54 | 7,363 | 80.99 | 1,728 | 19.01 |
| මතුගම | 3,630 | 1,146 | 31.57 | 450 | 12.40 | 747 | 20.58 | 681 | 18.76 | 3,024 | 83.31 | 606 | 16.69 |
| හොරණ | 5,720 | 1,424 | 24.90 | 727 | 12.71 | 1,248 | 21.82 | 1,224 | 21.40 | 4,623 | 80.82 | 1,097 | 19.18 |
| මහනුවර | 8,029 | 3,089 | 38.47 | 1,102 | 13.73 | 1,691 | 21.06 | 1,338 | 16.66 | 7,220 | 89.92 | 809 | 10.08 |
| දෙනුවර | 2,320 | 408 | 17.59 | 249 | 10.73 | 622 | 26.81 | 637 | 27.46 | 1,916 | 82.59 | 404 | 17.41 |
| ගම්පොළ | 4,055 | 643 | 15.86 | 419 | 10.33 | 962 | 23.72 | 1,115 | 27.50 | 3,139 | 77.41 | 916 | 22.59 |
| තෙල්දෙණිය | 2,122 | 291 | 13.71 | 263 | 12.39 | 655 | 30.87 | 584 | 27.52 | 1,793 | 84.50 | 329 | 15.50 |
| වත්තේගම | 3,107 | 564 | 18.15 | 367 | 11.81 | 834 | 26.84 | 823 | 26.49 | 2,588 | 83.30 | 519 | 16.70 |
| කටුගස්තොට | 3,484 | 474 | 13.61 | 393 | 11.28 | 928 | 26.64 | 989 | 28.39 | 2,784 | 79.91 | 700 | 20.09 |
| මාතලේ | 4,272 | 1,020 | 23.88 | 502 | 11.75 | 939 | 21.98 | 1,012 | 23.69 | 3,473 | 81.30 | 799 | 18.70 |
| ගලේවෙල | 2,790 | 349 | 12.51 | 319 | 11.43 | 828 | 29.68 | 794 | 28.46 | 2,290 | 82.08 | 500 | 17.92 |
| නාඋල | 622 | 98 | 15.76 | 96 | 15.43 | 178 | 28.62 | 162 | 26.05 | 534 | 85.85 | 88 | 14.15 |
| විල්ගමුව | 765 | 110 | 14.38 | 81 | 10.59 | 237 | 30.98 | 214 | 27.97 | 642 | 83.92 | 123 | 16.08 |
| නුවරඑළිය | 3,115 | 359 | 11.52 | 313 | 10.05 | 747 | 23.98 | 911 | 29.25 | 2,330 | 74.80 | 785 | 25.20 |
| කොත්මලේ | 1,628 | 223 | 13.70 | 187 | 11.49 | 432 | 26.54 | 447 | 27.46 | 1,289 | 79.18 | 339 | 20.82 |
| හැටන් | 3,401 | 533 | 15.67 | 324 | 9.53 | 822 | 24.17 | 941 | 27.67 | 2,620 | 77.04 | 781 | 22.96 |
| වළපනේ | 1,676 | 249 | 14.86 | 188 | 11.22 | 388 | 23.15 | 467 | 27.86 | 1,292 | 77.09 | 384 | 22.91 |
| හඟුරන්කෙත | 1,842 | 339 | 18.40 | 236 | 12.81 | 505 | 27.42 | 455 | 24.70 | 1,535 | 83.33 | 307 | 16.67 |
| ගාල්ල | 8,382 | 2,700 | 32.21 | 1,080 | 12.88 | 1,731 | 20.65 | 1,595 | 19.03 | 7,106 | 84.78 | 1,276 | 15.22 |
| ඇල්පිටිය | 3,724 | 655 | 17.59 | 460 | 12.35 | 1,046 | 28.09 | 925 | 24.84 | 3,086 | 82.87 | 638 | 17.13 |
| අම්බලන්ගොඩ | 3,672 | 929 | 25.30 | 444 | 12.09 | 777 | 21.16 | 847 | 23.07 | 2,997 | 81.62 | 675 | 18.38 |
| උඩුගම | 1,986 | 407 | 20.49 | 237 | 11.93 | 442 | 22.26 | 479 | 24.12 | 1,565 | 78.80 | 421 | 21.20 |
| මාතර | 6,157 | 2,055 | 33.38 | 821 | 13.33 | 1,345 | 21.85 | 1,113 | 18.08 | 5,334 | 86.63 | 823 | 13.37 |
| අකුරැස්ස | 2,332 | 597 | 25.60 | 324 | 13.89 | 597 | 25.60 | 512 | 21.96 | 2,030 | 87.05 | 302 | 12.95 |
| මුලටියන (හක්මන) | 2,539 | 604 | 23.79 | 390 | 15.36 | 671 | 26.43 | 560 | 22.06 | 2,225 | 87.63 | 314 | 12.37 |
| දෙණියාය (මොරවක) | 2,590 | 545 | 21.04 | 275 | 10.62 | 631 | 24.36 | 636 | 24.56 | 2,087 | 80.58 | 503 | 19.42 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තංගල්ල | 2,869 | 655 | 22.83 | 398 | 13.87 | 778 | 27.12 | 631 | 21.99 | 2,462 | 85.81 | 407 | 14.19 |
| හම්බන්තොට | 4,872 | 964 | 19.79 | 590 | 12.11 | 1,256 | 25.78 | 1,151 | 23.62 | 3,961 | 81.30 | 911 | 18.70 |
| වලස්මුල්ල | 3,342 | 1,005 | 30.07 | 512 | 15.32 | 796 | 23.82 | 659 | 19.72 | 2,972 | 88.93 | 370 | 11.07 |
| යාපනය | 2,937 | 1,062 | 36.16 | 332 | 11.30 | 464 | 15.80 | 455 | 15.49 | 2,313 | 78.75 | 624 | 21.25 |
| දූපත් | 496 | 53 | 10.69 | 34 | 6.85 | 88 | 17.74 | 124 | 25.00 | 299 | 60.28 | 197 | 39.72 |
| තෙන්මාරච්චි | 797 | 203 | 25.47 | 73 | 9.16 | 125 | 15.68 | 167 | 20.95 | 568 | 71.27 | 229 | 28.73 |
| වලිකාමම් | 2,315 | 402 | 17.37 | 187 | 8.08 | 360 | 15.55 | 505 | 21.81 | 1,454 | 62.81 | 861 | 37.19 |
| වඩමාරච්චි | 1,454 | 364 | 25.03 | 140 | 9.63 | 225 | 15.47 | 276 | 18.98 | 1,005 | 69.12 | 449 | 30.88 |
| කිලිනොච්චිය (දකුණ) | 2,005 | 399 | 19.90 | 225 | 11.22 | 393 | 19.60 | 446 | 22.24 | 1,463 | 72.97 | 542 | 27.03 |
| කිලිනොච්චිය (උතුර) | 561 | 144 | 25.67 | 66 | 11.76 | 122 | 21.75 | 106 | 18.89 | 438 | 78.07 | 123 | 21.93 |
| මන්නාරම | 1,414 | 242 | 17.11 | 119 | 8.42 | 278 | 19.66 | 324 | 22.91 | 963 | 68.10 | 451 | 31.90 |
| මඩු | 408 | 51 | 12.50 | 38 | 9.31 | 79 | 19.36 | 111 | 27.21 | 279 | 68.38 | 129 | 31.62 |
| වව්නියාව (දකුණ) | 2,100 | 430 | 20.48 | 184 | 8.76 | 390 | 18.57 | 490 | 23.33 | 1,494 | 71.14 | 606 | 28.86 |
| වව්නියාව (උතුර) | 587 | 60 | 10.22 | 44 | 7.50 | 109 | 18.57 | 164 | 27.94 | 377 | 64.22 | 210 | 35.78 |
| මුලතිව් | 1,403 | 288 | 20.53 | 129 | 9.19 | 257 | 18.32 | 302 | 21.53 | 976 | 69.57 | 427 | 30.43 |
| තුනුක්කායි | 613 | 105 | 17.13 | 74 | 12.07 | 132 | 21.53 | 133 | 21.70 | 444 | 72.43 | 169 | 27.57 |
| මඩකලපුව | 2,062 | 578 | 28.03 | 229 | 11.11 | 399 | 19.35 | 471 | 22.84 | 1,677 | 81.33 | 385 | 18.67 |
| කල්කුඩා | 1,375 | 203 | 14.76 | 143 | 10.40 | 340 | 24.73 | 350 | 25.45 | 1,036 | 75.35 | 339 | 24.65 |
| පදිරිප්පු | 1,630 | 354 | 21.72 | 170 | 10.43 | 305 | 18.71 | 398 | 24.42 | 1,227 | 75.28 | 403 | 24.72 |
| මඩකලපුව (මධ්‍යම) | 2,418 | 703 | 29.07 | 296 | 12.24 | 583 | 24.11 | 541 | 22.37 | 2,123 | 87.80 | 295 | 12.20 |
| මඩකලපුව (බටහිර) | 880 | 89 | 10.11 | 86 | 9.77 | 190 | 21.59 | 274 | 31.14 | 639 | 72.61 | 241 | 27.39 |
| අම්පාර | 2,864 | 740 | 25.84 | 398 | 13.90 | 726 | 25.35 | 622 | 21.72 | 2,486 | 86.80 | 378 | 13.20 |
| කල්මුණේ | 2,864 | 719 | 25.10 | 370 | 12.92 | 680 | 23.74 | 716 | 25.00 | 2,485 | 86.77 | 379 | 13.23 |
| සමන්තුරෙයි | 1,491 | 295 | 19.79 | 132 | 8.85 | 293 | 19.65 | 430 | 28.84 | 1,150 | 77.13 | 341 | 22.87 |
| මහඔය | 694 | 110 | 15.85 | 105 | 15.13 | 213 | 30.69 | 187 | 26.95 | 615 | 88.62 | 79 | 11.38 |
| දෙහිඅත්තකණ්ඩිය | 1,072 | 147 | 13.71 | 152 | 14.18 | 285 | 26.59 | 321 | 29.94 | 905 | 84.42 | 167 | 15.58 |
| අක්කරෙයිපත්තු | 1,874 | 445 | 23.75 | 228 | 12.17 | 472 | 25.19 | 482 | 25.72 | 1,627 | 86.82 | 247 | 13.18 |
| තිරුක්කෝවිල් | 839 | 201 | 23.96 | 106 | 12.63 | 201 | 23.96 | 205 | 24.43 | 713 | 84.98 | 126 | 15.02 |
| ත්‍රිකුණාමලය | 2,186 | 487 | 22.28 | 214 | 9.79 | 402 | 18.39 | 477 | 21.82 | 1,580 | 72.28 | 606 | 27.72 |
| මුතූර් | 1,278 | 266 | 20.81 | 125 | 9.78 | 301 | 23.55 | 324 | 25.35 | 1,016 | 79.50 | 262 | 20.50 |
| කන්තලේ | 1,271 | 171 | 13.45 | 125 | 9.83 | 304 | 23.92 | 351 | 27.62 | 951 | 74.82 | 320 | 25.18 |
| කින්නියා | 1,674 | 223 | 13.32 | 129 | 7.71 | 289 | 17.26 | 436 | 26.05 | 1,077 | 64.34 | 597 | 35.66 |
| ත්‍රිකුණාමලය (උතුර) | 426 | 36 | 8.45 | 37 | 8.69 | 94 | 22.07 | 141 | 33.10 | 308 | 72.30 | 118 | 27.70 |
| කුරුණෑගල | 7,184 | 2,320 | 32.29 | 896 | 12.47 | 1,637 | 22.79 | 1,328 | 18.49 | 6,181 | 86.04 | 1,003 | 13.96 |
| කුලියාපිටිය | 4,610 | 1,159 | 25.14 | 530 | 11.50 | 1,054 | 22.86 | 1,084 | 23.51 | 3,827 | 83.02 | 783 | 16.98 |
| නිකවැරටිය | 3,418 | 670 | 19.60 | 455 | 13.31 | 919 | 26.89 | 844 | 24.69 | 2,888 | 84.49 | 530 | 15.51 |
| මහව | 4,458 | 744 | 16.69 | 550 | 12.34 | 1,159 | 26.00 | 1,245 | 27.93 | 3,698 | 82.95 | 760 | 17.05 |
| ගිරිඋල්ල | 4,458 | 966 | 21.67 | 523 | 11.73 | 1,065 | 23.89 | 1,073 | 24.07 | 3,627 | 81.36 | 831 | 18.64 |
| ඉබ්බාගමුව | 3,571 | 788 | 22.07 | 434 | 12.15 | 934 | 26.16 | 886 | 24.81 | 3,042 | 85.19 | 529 | 14.81 |
| පුත්තලම | 6,162 | 947 | 15.37 | 601 | 9.75 | 1,330 | 21.58 | 1,656 | 26.87 | 4,534 | 73.58 | 1,628 | 26.42 |
| හලාවත | 6,107 | 1,251 | 20.48 | 646 | 10.58 | 1,336 | 21.88 | 1,505 | 24.64 | 4,738 | 77.58 | 1,369 | 22.42 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | 5,499 | 1,453 | 26.42 | 621 | 11.29 | 1,276 | 23.20 | 1,176 | 21.39 | 4,526 | 82.31 | 973 | 17.69 |
| තඹුත්තේගම | 3,132 | 472 | 15.07 | 345 | 11.02 | 833 | 26.60 | 883 | 28.19 | 2,533 | 80.87 | 599 | 19.13 |
| කැකිරාව | 3,450 | 694 | 20.12 | 421 | 12.20 | 829 | 24.03 | 858 | 24.87 | 2,802 | 81.22 | 648 | 18.78 |
| ගලෙන්බිදුණුවැව | 2,163 | 320 | 14.79 | 235 | 10.86 | 584 | 27.00 | 610 | 28.20 | 1,749 | 80.86 | 414 | 19.14 |
| කැබිතිගොල්ලෑව | 2,536 | 464 | 18.30 | 323 | 12.74 | 746 | 29.42 | 609 | 24.01 | 2,142 | 84.46 | 394 | 15.54 |
| පොළොන්නරුව | 2,242 | 599 | 26.72 | 284 | 12.67 | 486 | 21.68 | 510 | 22.75 | 1,879 | 83.81 | 363 | 16.19 |
| හිඟුරක්ගොඩ | 2,964 | 477 | 16.09 | 309 | 10.43 | 712 | 24.02 | 781 | 26.35 | 2,279 | 76.89 | 685 | 23.11 |
| දිඹුලාගල | 1,804 | 195 | 10.81 | 140 | 7.76 | 365 | 20.23 | 568 | 31.49 | 1,268 | 70.29 | 536 | 29.71 |
| බදුල්ල | 2,990 | 794 | 26.56 | 387 | 12.94 | 633 | 21.17 | 638 | 21.34 | 2,452 | 82.01 | 538 | 17.99 |
| බණ්ඩාරවෙල | 3,716 | 1,096 | 29.49 | 501 | 13.48 | 849 | 22.85 | 771 | 20.75 | 3,217 | 86.57 | 499 | 13.43 |
| මහියංගණය | 2,242 | 336 | 14.99 | 251 | 11.20 | 546 | 24.35 | 642 | 28.64 | 1,775 | 79.17 | 467 | 20.83 |
| වැලිමඩ | 2,648 | 483 | 18.24 | 313 | 11.82 | 695 | 26.25 | 690 | 26.06 | 2,181 | 82.36 | 467 | 17.64 |
| පස්සර | 1,212 | 181 | 14.93 | 148 | 12.21 | 302 | 24.92 | 325 | 26.82 | 956 | 78.88 | 256 | 21.12 |
| වියළුව | 973 | 122 | 12.54 | 116 | 11.92 | 285 | 29.29 | 284 | 29.19 | 807 | 82.94 | 166 | 17.06 |
| මොණරාගල | 2,670 | 522 | 19.55 | 304 | 11.39 | 657 | 24.61 | 678 | 25.39 | 2,161 | 80.94 | 509 | 19.06 |
| වැල්ලවාය | 2,076 | 376 | 18.11 | 236 | 11.37 | 527 | 25.39 | 526 | 25.34 | 1,665 | 80.20 | 411 | 19.80 |
| බිබිලේ | 2,185 | 414 | 18.95 | 271 | 12.40 | 550 | 25.17 | 570 | 26.09 | 1,805 | 82.61 | 380 | 17.39 |
| තණමල්විල | 1,621 | 290 | 17.89 | 196 | 12.09 | 438 | 27.02 | 448 | 27.64 | 1,372 | 84.64 | 249 | 15.36 |
| රත්නපුර | 7,273 | 2,213 | 30.43 | 888 | 12.21 | 1,542 | 21.20 | 1,507 | 20.72 | 6,150 | 84.56 | 1,123 | 15.44 |
| බලංගොඩ | 3,206 | 698 | 21.77 | 394 | 12.29 | 755 | 23.55 | 780 | 24.33 | 2,627 | 81.94 | 579 | 18.06 |
| නිවිතිගල | 2,735 | 427 | 15.61 | 313 | 11.44 | 635 | 23.22 | 695 | 25.41 | 2,070 | 75.69 | 665 | 24.31 |
| ඇඹිලිපිටිය | 4,749 | 1,047 | 22.05 | 663 | 13.96 | 1,182 | 24.89 | 1,085 | 22.85 | 3,977 | 83.74 | 772 | 16.26 |
| කෑගල්ල | 4,836 | 1,321 | 27.32 | 659 | 13.63 | 1,198 | 24.77 | 989 | 20.45 | 4,167 | 86.17 | 669 | 13.83 |
| මාවනැල්ල | 4,086 | 810 | 19.82 | 486 | 11.89 | 965 | 23.62 | 1,033 | 25.28 | 3,294 | 80.62 | 792 | 19.38 |
| දෙහිඕවිට | 4,273 | 702 | 16.43 | 494 | 11.56 | 1,055 | 24.69 | 1,088 | 25.46 | 3,339 | 78.14 | 934 | 21.86 |
| **එකතුව** | **329,296** | **78,413** | **23.81** | **39,320** | **11.94** | **75,376** | **22.89** | **75,440** | **22.91** | **268,549** | **81.55** | **60,747** | **18.45** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024 ශ්‍රී. ලං.වි.දෙ

### 1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය

**වගුව 1.5**

පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 16,176 | 4.69 | 345,092 | 100.00 |
| 81 - 90 | 40,278 | 11.67 | 328,916 | 95.31 |
| 71 - 80 | 39,237 | 11.37 | 288,638 | 83.64 |
| 61 - 70 | 42,183 | 12.22 | 249,401 | 72.27 |
| 51 60 | 49,672 | 14.39 | 207,218 | 60.05 |
| 41 - 50 | 53,844 | 15.60 | 157,546 | 45.65 |
| 31 - 40 | 49,321 | 14.29 | 103,702 | 30.05 |
| 21 - 30 | 35,608 | 10.32 | 54,381 | 15.76 |
| 11 - 20 | 16,958 | 4.91 | 18,773 | 5.44 |
| 00 - 10 | 1,815 | 0.53 | 1,849 | 0.54 |

මූලාශ්‍රය **:** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

ඉතිහාසය විෂය සඳහා 00 –10 පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 1815ක් වන අතර ඉන් අපේක්ෂකයන් 34 දෙනෙකු කිසිදු ලකුණක් ලබා ගැනීමට සමත් වී නැත.

# II කොටස

## 2 ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය

### 2.1 ඉතිහාසය I පත්‍රයේ ව්‍යුහය

**I පත්‍රය -** කාලය පැය 01යි. මුළු ලකුණු 80යි.

බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 80කි.

මූලාශ්‍රය : අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය වර්ෂ 2016 හා ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2016, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.2 ඉතිහාසය I පත්‍රය

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

ඉතිහාසය I
வரலாறு I
History I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අතීත ශ්‍රී ලංකාවේ වෙළෙඳාම හා ලෝහ කර්මාන්තය පිළිබඳ හැදෑරීමේ දී වැදගත් මූලාශ්‍රය වන්නේ මින් කුමක් ද?
(1) අභිලේඛණ (2) නටබුන් (3) ස්මාරක (4) කාසි

**2.** මෙරට බ්‍රාහ්මීය සෙල්ලිපිවල බහුලව සඳහන් වන තොරතුර වන්නේ මින් කුමක් ද?
(1) භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම (2) රජයේ නීති මහජනයාට දැන්වීම
(3) බදු අය කිරීම (4) විහාර ආරාම පරිපාලනය

**3.** ප්‍රාග් ඓතිහාසික යුගයේ තාක්ෂණය පිළිබඳ දැනගැනීමට ඇති එකම සාධකය වන්නේ,
(1) සුසාන භූමි ය. (2) නිවාස ය. (3) ගල් මෙවලම් ය. (4) මැටි වළං ය.

**4.** මුල් යුගයේ ජනතාව ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශ පදිංචිය සඳහා තෝරා ගැනීමට හේතුව කුමක් ද?
(1) ගංවතුර උවදුරෙන් බේරීම (2) කෘෂිකර්මාන්තයට හිතකර සාධක පැවතීම
(3) වන සතුන්ගෙන් ආරක්ෂා වීම (4) ගමනාගමන පහසුව

● A, B, C හා D යන ප්‍රකාශ ඇසුරෙන් පහත 5 සහ 6 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A – වැව් කේන්ද්‍ර කරගනිමින් ජනාවාස බිහිවීම
B – ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම
C – විවිධ වෘත්තීන්ට අනුව ජනාවාස බිහිවීම
D – කෘෂිකාර්මික කටයුතු ආරම්භ වීම

**5.** පූර්ව ඓතිහාසික යුගය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය.

**6.** මුල් ඓතිහාසික යුගය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය.

**7.** ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් බෙල්ලන් වර්ග සුලභව දක්නට ලැබෙන පරිසර කලාපය කුමක් ද?
(1) පහතරට වියළි කලාපය (2) පහතරට තෙත් කලාපය
(3) ශුෂ්ක කලාපය (4) කඳුකර වියළි කලාපය

**8.** **I තීරුවේ** සඳහන් කාර්ය හා සම්බන්ධ රජවරුන්ගේ නම් **II තීරුවේ** දැක්වේ. **I තීරුව** සමග **II තීරුව** අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සීගිරිය බලකොටුව ඉදිකිරීම | A – දේවානම්පිය තිස්ස |
| 2. පරුමකවරුන් රජයේ ඉහළ තනතුරුවලට පත් කිරීම | B – වළගම්බා |
| 3. ශ්‍රී මහා බෝධි ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම | C – පළමුවන කාශ්‍යප |
| | D – දුටුගැමුණු |

(1) A, B, C (2) C, B, D (3) C, D, A (4) D, A, B

**9.** වසභ, මහසෙන් හා මහා පරාක්‍රමබාහු යන රජවරුන් පිළිබඳ පොදු කරුණ වන්නේ මින් කුමක් ද?
(1) රට එක්සේසත් කිරීම (2) විදේශ ආක්‍රමණවලින් රට බේරාගැනීම
(3) විශාල වෙහෙර විහාර ඉදිකිරීම (4) වාරි කර්මාන්තයේ දියුණුවට කටයුතු කිරීම

**10.** රටක දේශපාලන බලය මධ්‍යගත වූ විට,
(1) එක්සත් රාජ්‍යයක් බිහි වේ. (2) රටේ බෙදීමක් ඇති වේ.
(3) විදේශ රාජ්‍යයකට යටත් වේ. (4) යටත්විජිතයන් හිමි වේ.

**11.** අනුරාධපුර රාජධානි සමයේ මෙරට වෙළෙඳ කටයුතුවල නිරත වූ බොහෝමයක් වෙළෙඳ සංවිධාන අයත් වූයේ,
(1) උතුරු ඉන්දියානුවන්ට ය. (2) දකුණු ඉන්දියානුවන්ට ය.
(3) චීන ජාතිකයන්ට ය. (4) පර්සියානු ජාතිකයින්ට ය.

**12.** 'වෙජ්ජසාලා' යනු කුමක් ද?
(1) ආරෝග්‍යශාලා (2) හින්දු ආගමික මධ්‍යස්ථාන
(3) නෘත්‍යශාලා (4) අධ්‍යාපන මධ්‍යස්ථාන

**13.** මහවැලි ගඟේ අතු ගංගාව කුමක් ද?
(1) මැණික් ගඟ (2) අඹන් ගඟ (3) දැදුරු ඔය (4) කලා ඔය

- පහත A, B, C හා D යන ප්‍රකාශ ඇසුරෙන් **14** හා **15** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – පොළවට ලම්බාකාර බිත්ති බැඳීම
B – පදම් කළ මැටි භාවිත කිරීම
C – සුසාන ගර්භයට මැටි නළ සවි කිරීම
D – මැටි බඳුනට දහයියා පුරවා පිළිස්සීම

**14.** අතීතයේ නිවාස තැනීමේ තාක්ෂණය දැන සිටි බව තහවුරු කෙරෙන ප්‍රකාශය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**15.** අතීතයේ දහනය සඳහා වායුව අවශ්‍ය යැයි දැන සිටි බව තහවුරු කෙරෙන ප්‍රකාශය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**16.** අතීතයේ මැනීම සඳහා යොදාගත් මිනුම් ඒකක **I තීරුවේ** ද මැනීම සිදු කළ දෑ **II තීරුවේ** ද දැක්වේ. **I තීරුව** හා **II තීරුව** අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අමුණ | A – කාලය |
| 2. වියත | B – භූමිය (අවකාශය) |
| 3. කත | C – දිග |
| | D – බර |

(1) A, B, C (2) B, C, A (3) C, B, D (4) D, A, B

**17.** සීගිරි ජලමල්වල ජල කඳේ උස වෙනස් කිරීමට අතීත නිර්මාණ ශිල්පීන් යොදාගත් උපක්‍රමය වූයේ,
(1) ගල් පතුරේ සිදුරුවල විෂ්කම්භය සමානව නිර්මාණය කිරීම ය.
(2) ගල් පතුරේ සිදුරුවල විෂ්කම්භය වෙනස්ව නිර්මාණය කිරීම ය.
(3) සිදුරු සහිත ගල් පතුරේ ඝනකම වැඩි කිරීම ය.
(4) සිදුරු සහිත ගල් පතුරේ ඝනකම අඩු කිරීම ය.

**18.** අතීතයේ ශ්‍රී ලංකාව හා පැවැති විදේශ වෙළෙඳ ගනුදෙනුවල දී භාවිත කළ කාසි පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සෑම කාසියක්ම එකම ලෝහයකින් සාදා තිබීම
(2) සෑම කාසියක්ම සමාන බරකින් යුතු වීම
(3) ඕනෑම රටකට අයත් කාසි වෙළෙඳ ගනුදෙනු සඳහා භාවිත කිරීම
(4) ජාත්‍යන්තරව පිළිගත් පොදු කාසි වර්ගයක් ගනුදෙනු සඳහා භාවිත කිරීම

**19.** හේන් වගා කිරීම වෙනුවෙන් රජයට අය කරගත් බද්ද හැඳින්වූයේ මින් කුමන නමකින් ද?
(1) මතරමජිබක (2) කැති අඩ (3) දකපති (4) බොජකපති

**20.** අතීතයේ දී ආහාරය සඳහා බහුලවම භාවිත වූ ධාන්‍ය වර්ගයක් වන්නේ මින් කුමක් ද?
(1) තිරිඟු (2) වී (3) බාර්ලි (4) කව්පි

- පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් **21** ප්‍රශ්නය සඳහා පිළිතුරු ලියන්න.

  A – මෙරට අවසාන රාජධානිය වීම

  B – ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අවසාන පාලකයා වීම

**21.** මහනුවර රාජධානිය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(3) A හා B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**22.** පෘතුගීසින්, ලන්දේසින් හා ඉංග්‍රීසින් සම්බන්ධතා පැවැත්වූ රාජධානිය කුමක් ද?
(1) සීතාවක (2) රයිගම (3) කෝට්ටේ (4) මහනුවර

**23.** පෘතුගීසීන් හා යාපනේ පාලකයන් අතර නිරතුරුව ගැටුම් ඇතිවීම කෙරෙහි බලපෑ ප්‍රධානතම හේතුව වූයේ,
(1) පහතරට සිංහල පාලකයන්ගේ පෘතුගීසි විරෝධී සටන්වලට යාපනේ පාලකයන් සහාය දැක්වීමයි.
(2) මන්නාරම් මුහුදේ මුතු කිමිදීමේ කටයුතුවල දී යාපනේ පාලකයන්ගෙන් පෘතුගීසීන්ට බාධා එල්ල වීමයි.
(3) යාපනේ සිංහාසනයට උරුමකම් කියූ ඇතැම් ද්‍රවිඩ කුමාරවරුන් පෘතුගීසීන්ට පක්ෂව කටයුතු කිරීමයි.
(4) යාපනය රාජධානියේ කතෝලික ආගම ප්‍රචාරය කිරීමට එරෙහිව එහි පාලකයන්ගෙන් දැඩි විරෝධතා එල්ල වීමයි.

**24.** මධ්‍යතන යුගයේ දී ආසියානු වෙළෙඳ ඒකාධිකාරය හිමි වූයේ,
(1) රෝමවරුන්ට ය. (2) මුස්ලිම්වරුන්ට ය. (3) ඉන්දියානුවන්ට ය. (4) පෘතුගීසීන්ට ය.

**25.** කොන්ස්තන්තිනු ද සා ඇතුළු පෘතුගීසි හමුදාව පරාජයට පත් වූයේ කුමන සටනේදී ද?
(1) දන්තුරේ (2) බලන (3) රන්දෙණිවල (4) ගන්නෝරුව

**26.** කාර්මීකරණය නිසා සමාජීය වශයෙන් සිදු වූ පරිවර්තනයක් වන්නේ,
(1) බහු ජාතික ව්‍යාපාර වර්ධනය වීම ය. (2) බැංකු සේවා පුළුල් වීම ය.
(3) නාගරීකරණය වේගවත් වීම ය. (4) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩිදියුණු වීම ය.

**27.** පහත A – E දක්වා ඇති තොරතුරුවලින් කාර්මික විප්ලවය නිසා ඇති වූ **අහිතකර** ප්‍රතිඵල පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

A – මිනිස් ශ්‍රමය වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම
B – පරිසර දූෂණය
C – රැකියා සුලභ වීම
D – ශ්‍රම සූරාකෑම
E – යටිතල පහසුකම් දියුණු වීම

(1) A සහ D (2) B සහ D (3) B සහ E (4) C සහ D

**28.** **I තීරුවෙන්** හා **II තීරුවෙන්** බ්‍රිතාන්‍යයන් මෙරට බලය ලබාගැනීම පිළිබඳ තොරතුරු කිහිපයක් දැක්වේ. **I තීරුවට** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. කිව් ලිපිය | A – වෙළෙඳ සම්බන්ධතා ඇති කරගැනීමට යොමු වීම |
| 2. මද්‍රාසි නිලධාරීන් | B – ලන්දේසි සතු ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ට පැවරීම |
| | C – මුහුදුබඩ ප්‍රදේශ පරිපාලනය කිරීම |

(1) A සහ B (2) B සහ C (3) C සහ A (4) C සහ B

- බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක ලක්ෂණ පහත දැක්වේ. ඒවා ඇසුරෙන් **29** හා **30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A – ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදීම
  B – මහජන ඡන්දයෙන් නියෝජිතයින් තෝරාගැනීම
  C – ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම
  D – රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

**29.** කෝල්බෘක් ප්‍රතිසංස්කරණ යෝජනා පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D

**30.** ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D

- පහත A, B, C හා D ප්‍රකාශ ඇසුරෙන් **31** හා **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A – සුළු අාරවුල් පිළිබඳ නඩු විසඳීම
  B – ගමේ ඇළ වේළි සකස් කිරීම හා නඩත්තුව
  C – කුමන්ත්‍රණ නඩු විසඳීම
  D – විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු විසඳීම

**31.** ගම්සභාව සතු බලතල දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) C සහ D

**32.** රජු සතු බලතල දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) C සහ D

- පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා අංක **33** සිට **35** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A – 1. සින්කෝනා වගාව
  2. ලූල්කඳුර වත්ත

  B – 1. බ්‍රිතාන්‍ය පාලනය
  2. මධ්‍යම පන්තිය

  C – 1. ශ්‍රමයට වැටුප් ගෙවීම
  2. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය

  D – 1. හෙමලියා වෙස්ටර්ට්‍රික්ස්
  2. කෝපි වගාව

**33.** පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න බිහි වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**34.** දෙවැන්න අහෝසි කිරීමත් සමග පළමුවැන්න ආරම්භ වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**35.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් **නොදැක්වෙන** යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**36.** පහත A, B, C හා D වලින් දක්වා ඇති කරුණු අතුරෙන් අමෙරිකානු විප්ලවය හා ප්‍රංශ විප්ලවය යන විප්ලව දෙකට ම හේතු වූ පොදු කරුණක් වන්නේ කුමක් ද?

A – පාලකයන්ගේ සුඛෝපභෝගී ජීවිතය
B – අසාධාරණ බදු පැනවීම
C – දාර්ශනික මතවාදවල බලපෑම
D – වැඩවසම් සමාජ ක්‍රමයේ බලපෑම

(1) A (2) B (3) C (4) D

**37.** කුඩා රාජ්‍යයන් විශාල සංඛ්‍යාවක් ඒකාබද්ධ කොට 'ජර්මනිය' නමින් බලවත් රාජ්‍යයක් නිර්මාණය කළ නායකයා වන්නේ,
(1) දෙවන විලියම් (කයිසර්) ය. (2) වොන් වොල්ක් ය.
(3) ඔටෝ වොන් බිස්මාර්ක් ය. (4) ඇඩොල්ෆ් හිට්ලර් ය.

**38.** විප්ලවයට පෙර රුසියානුවන්ට උග්‍ර ආහාර හිඟයකට මුහුණදීමට සිදු වූයේ,
(1) ඉඩම්වල අයිතිය රදළයන් සතු වූ නිසා ය.
(2) වැඩවසම් ආර්ථිකය බිඳවැටීම නිසා ය.
(3) ගොවීන් හමුදා සේවයට බඳවාගැනීම නිසා ය.
(4) අස්වැන්නෙන් කොටසක් බදු වශයෙන් ගෙවීමට සිදු වූ නිසා ය.

**39.** "මේ අවස්ථාවේ අප බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත" මෙම ප්‍රකාශය කිනම් විප්ලවයක් හා සම්බන්ධ වේ ද?
(1) අමෙරිකානු විප්ලවය (2) ප්‍රංශ විප්ලවය
(3) රුසියානු විප්ලවය (4) චීන විප්ලවය

**40.** ලෝක ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමේ අරමුණින් පිහිටුවා ඇති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධ ආයතනය හඳුන්වන කෙටි නම කුමක් ද?
(1) ILO (2) UNESCO (3) WHO (4) UNICEF

***

## 2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය

### වගුව 2.1

ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | ප්‍රශ්න අංකය | නිවැරදි වරණය |
|---|---|---|---|
| 01. | **4** | 21. | **1** |
| 02. | **1** | 22. | **4** |
| 03. | **3** | 23. | **4** |
| 04. | **1** | 24. | **2** |
| 05. | **4** | 25. | **3** |
| 06. | **1** | 26. | **3** |
| 07. | **2** | 27. | **2** |
| 08. | **3** | 28. | **2** |
| 09. | **4** | 29. | **2** |
| 10. | **1** | 30. | **4** |
| 11. | **2** | 31 | **1** |
| 12. | **1** | 32 | **4** |
| 13. | **2** | 33 | **2** |
| 14. | **1** | 34 | **3** |
| 15. | **3** | 35 | **1** |
| 16. | **2** | 36 | **2** |
| 17. | **2** | 37 | **3** |
| 18. | **3** | 38 | **3** |
| 19. | **2** | 39 | **3** |
| 20. | **2** | 40 | **3** |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

මූලාශ්‍රය - අ.පො.ස (සා.පෙළ) ඉතිහාසය ලකුණුදීමේ පටිපාටිය, 2024 ශ්‍රී.ලං.වි.දෙ.

## 2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය

**වගුව 2.2**

එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය | | | | ** |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | |
| 1 | **4** | 4.65 | 2.73 | 1.53 | 91.09 | 0.00 |
| 2 | **1** | 72.62 | 13.66 | 6.31 | 7.15 | 0.26 |
| 3 | **3** | 6.89 | 4.13 | 84.07 | 4.81 | 0.10 |
| 4 | **1** | 63.87 | 28.46 | 3.32 | 4.29 | 0.07 |
| 5 | **4** | 6.67 | 10.76 | 13.46 | 68.62 | 0.49 |
| 6 | **1** | 68.49 | 14.86 | 10.28 | 6.08 | 0.29 |
| 7 | **2** | 9.37 | 83.45 | 4.07 | 3.02 | 0.10 |
| 8 | **3** | 2.21 | 13.27 | 81.37 | 3.06 | 0.10 |
| 9 | **4** | 5.40 | 3.38 | 4.94 | 86.11 | 0.16 |
| 10 | **1** | 83.38 | 7.51 | 3.54 | 5.50 | 0.07 |
| 11 | **2** | 10.86 | 71.06 | 8.59 | 9.27 | 0.23 |
| 12 | **1** | 88.72 | 5.69 | 3.19 | 2.24 | 0.16 |
| 13 | **2** | 9.56 | 74.89 | 9.50 | 5.66 | 0.39 |
| 14 | **1** | 89.76 | 6.50 | 1.95 | 1.66 | 0.13 |
| 15 | **3** | 2.05 | 3.77 | 64.26 | 29.63 | 0.29 |
| 16 | **2** | 3.87 | 79.58 | 11.09 | 5.20 | 0.26 |
| 17 | **2** | 9.95 | 70.28 | 10.89 | 8.68 | 0.20 |
| 18 | **3** | 7.09 | 6.83 | 57.59 | 28.33 | 0.16 |
| 19 | **2** | 6.96 | 70.08 | 9.04 | 13.69 | 0.23 |
| 20 | **2** | 24.52 | 59.38 | 9.98 | 5.85 | 0.26 |
| 21 | **1** | 69.79 | 12.36 | 3.80 | 13.92 | 0.13 |
| 22 | **4** | 7.15 | 3.12 | 21.07 | 68.49 | 0.16 |
| 23 | **4** | 13.40 | 17.95 | 14.11 | 54.15 | 0.39 |
| 24 | **2** | 13.76 | 57.27 | 9.89 | 18.86 | 0.23 |
| 25 | **3** | 18.83 | 11.87 | 55.06 | 14.02 | 0.23 |
| 26 | **3** | 9.17 | 7.32 | 58.73 | 24.65 | 0.13 |
| 27 | **2** | 5.30 | 85.01 | 5.72 | 3.71 | 0.26 |
| 28 | **2** | 5.85 | 72.94 | 16.39 | 4.59 | 0.23 |
| 29 | **2** | 4.94 | 74.93 | 8.62 | 11.19 | 0.33 |
| 30 | **4** | 4.72 | 12.29 | 6.50 | 76.29 | 0.20 |
| 31 | **1** | 83.15 | 10.50 | 3.71 | 2.57 | 0.07 |
| 32 | **4** | 1.53 | 3.97 | 10.41 | 84.00 | 0.10 |
| 33 | **2** | 11.48 | 67.28 | 11.90 | 9.07 | 0.26 |
| 34 | **3** | 6.50 | 10.28 | 77.69 | 5.40 | 0.13 |
| 35 | **1** | 57.40 | 13.82 | 5.24 | 23.28 | 0.26 |
| 36 | **2** | 15.12 | 62.21 | 11.84 | 10.60 | 0.23 |
| 37 | **3** | 11.61 | 5.37 | 70.05 | 12.75 | 0.23 |
| 38 | **3** | 11.58 | 16.46 | 52.23 | 19.41 | 0.33 |
| 39 | **3** | 13.20 | 22.60 | 60.13 | 3.77 | 0.29 |
| 40 | **3** | 3.84 | 22.28 | 52.29 | 21.20 | 0.39 |


**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

** උත්සාහ නොකළ හෝ එක් වරණයකට වඩා වැඩියෙන් ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂක ප්‍රතිශතය

## 2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක

**ප්‍රස්තාරය 2.1**

I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/5/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.6 I පත්‍රයේ විශ්ලේෂණය


I පත්‍රයේ ප්‍රශ්න 40න් ප්‍රශ්න 32ක් ලංකා ඉතිහාසයෙන් ද, ප්‍රශ්න 08ක් ලෝක ඉතිහාසයෙන් ද, තෝරාගෙන තිබේ. I පත්‍රය සඳහා ප්‍රශ්න සකස් කිරීමේ දී ඉතිහාසය විෂය නිර්දේශයට අනුව අදාළ නිපුණතාවන් ආවරණය වන පරිදි සකස් කොට තිබේ.

| නිපුණතාව | ප්‍රශ්න අංකය |
|---|---|
| ඉතිහාසය ගොඩනැගීමට උපකාරි වන මූලාශ්‍රය අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනියි. | 1,2 |
| මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි. | 3,4,5,6,7 |
| රටක දේශපාලන බලය විකාශනයට හේතු විමර්ශනය කරයි. | 8,9,10 |
| අතීත අත්දැකීම් ඇසුරෙන් වර්තමානයට ආදර්ශ ගනියි. | 11,12 |
| ශ්‍රී ලාංකික අභිමානය ලොව පතළ කළ අපේ ආදි මුතුන් මිත්තන්ගේ අද්විතීය විද්‍යාත්මක ඥානය සහ තාක්ෂණ කුසලතා මහිමය අධ්‍යයනය කරමින් එවැනි කුසලතා වර්ධනය කර ගනියි. | 13,14,15 |
| ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජන සමාජයෙන් උරුම වූ දර්ශනය හා සම්ප්‍රදාය අවබෝධ කර ගනිමින් ඒවා තම ජීවිතය හැඩගසා ගැනීමට උපයෝගී කර ගනියි. | 16,17,18,19,20 |
| රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳවැටීම නිසා සමාජයේ විවිධ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් විග්‍රහ කරයි. | |
| ශ්‍රී ලාංකික රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගයමින් දේශීය උරුමය රැක ගැනීමට පෙළඹේ. | 21 |
| ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි ආනුභාව ලබා ඇති ආකාරය විමසා බලා තම උරුමය හා අනන්‍යතාව රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තතිය ඇති කර ගනියි. | 24 |
| ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගනියි. | 26,27 |
| රටක විදේශ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා බලපාන සාධක බටහිර ජාතීන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම ඇසුරෙන් විමර්ශනය කරයි. | 22,23,25,28 |
| ශ්‍රී ලාංකේය සම්ප්‍රදාය හා සංස්කෘතිය රැක ගැනීමට ක්‍රියා කළ නායකයින් අගයමින් එම ආදර්ශ චරිතායනය කර ගනියි. | |
| ජාතික ව්‍යාපාරය ඇසුරෙන් ජාතික ඒකාබද්ධතාව සහ සාමග්‍රිය පවත්වාගෙන යෑමේ වැදගත්කම මතුකර දක්වයි. | 29,30 |
| ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජ ව්‍යූහයට අනුකූලනය වූ ආකාරය විග්‍රහ කරයි. | 31,32,33,34,35 |
| නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය විමසා බලයි. | |
| ඓතිහාසික ගෝලීය දේශපාලන ප්‍රවණතාවල ආදර්ශ ආදේශනය කර ගනියි. | 36,38,39 |
| නූතන ලෝකයේ දේශපාලන ගැටුම්වල ස්වභාවය විමසා බලා එවැනි ගැටුම් පිටු දැකීම සඳහා ආකල්පමය පරිවර්තනයන් ඇති කර ගනියි. | 37. 40 |

## 2.7 නිපුණතා අනුව පහසුතා දර්ශකය

ප්‍රස්තාරය 2.2

I පත්‍රය විෂය නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/5/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024 ශ්‍රී. ලං. වි. දෙ.

## 2.8 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**ප්‍රශ්න අංක 38**

I පත්‍රයේ 38 ප්‍රශ්නය "ඓතිහාසික ගෝලීය දේශපාලන ප්‍රවණතාවල ආදර්ශ ආදර්ශනය කර ගනියි." යන නිපුණතාව ආවරණය වන පරිදි සකස් කොට තිබේ. විප්ලවයට පෙර රුසියානුවන්ට උග්‍ර ආහාර හිඟයකට මුහුණ දීමට සිදු වූයේ කුමක් නිසා දැයි අසන ලද ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වන්නේ ගොවීන් හමුදා සේවයට බඳවා ගැනීම යන 3 වරණයයි. එම නිවැරදි පිළිතුර අපේක්ෂකයන්ගෙන් 52.23%ක් පමණ තෝරාගෙන තිබේ. නමුත් 19.41%ක අපේක්ෂකයන් පිරිසක් නිවැරදි පිළිතුර ලෙස "අස්වැන්නෙන් කොටසක් බදු වශයෙන් ගෙවීමට සිදු වූ නිසාය" යන 4 වරණය තෝරාගෙන තිබේ. මෙම වරණය තෝරාගත් අපේක්ෂකයන් ගැඹුරින් සිතා බැලීමක් සිදු නොකළ බවක් දක්නට ලැබේ. බදු අය කර ගැනීම සැමවිටම සමාජය පීඩාවට පත් කරවන්නක් බවට ජන සමාජය තුළ අදහසක් මුල් බැස ගෙන තිබීම සහ ලෝකයේ කැපී පෙනෙන විප්ලව පාඩමේ ඇමරිකන්, ප්‍රංශ හා රුසියන් විප්ලවයන් සම්බන්ධව තොරතුරු ගෙනහැර දැක්වීමේ දී බදු අය කිරීම සාමාන්‍ය ජනතාව දැඩි පීඩාවට පත්වූ බව ඒත්තු ගැන්වෙන පරිදි බොහෝ සෙයින් කරුණු දක්වා තිබීම මෙම 4 වරණය තෝරා ගැනීමට හේතුව ලෙස දැක්විය හැකිය.

**ප්‍රශ්න අංක 40**

I පත්‍රයේ 40 ප්‍රශ්නය "නූතන ලෝකයේ දේශපාලන ගැටුම් පිළිබඳ ස්වභාවය විමසා බලා එවැනි ගැටුම් පිටුදැකීම සඳහා ආකල්පමය පරිවර්තනය ඇතිකර ගනියි" යන නිපුණතාව ආවරණය වන පරිදි සකස් කොට තිබේ. ලෝක ප්‍රජාවගේ සෞඛ්‍ය තත්වය නංවාලීමේ අරමුණින් පිහිටුවා ඇති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධ ආයතනය හඳුන්වන කෙටි නම කුමක් දැයි අසන ලද ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වන්නේ 'WHO' වන 3 වරණයයි. පෙළ පොතේ 'WHO' යනු ලෝක සෞඛ්‍ය සංවිධානය ලෙස පැහැදිලිව දක්වා තිබුණ ද නිවැරදි පිළිතුර සඳහන් කොට ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 52.29%ක ප්‍රමාණයකි. ජනමාධ්‍ය තුළ මෙන්ම සාමාන්‍ය ව්‍යවහාරයේදී ' WHO' යන වචනය වෙනුවට බහුල වශයෙන් 'ලෝක සෞඛ්‍ය සංවිධානය' යනුවෙන් භාවිත කිරීම නිසා අපේක්ෂකයන්ට 'WHO' යන්න එතරම් හුරු නොවීම එයට හේතුවක් වන්නට ඇතැයි උපකල්පන කළ හැකිය. එසේම අපේක්ෂකයන්ගෙන් 22.28%ක පිරිසක් නිවැරදි පිළිතුර ලෙස 'UNESCO' යන දෙවැනි වරණය තෝරාගෙන තිබේ. 'UNESCO' යන නාමය නිතර ජන මාධ්‍යයේ භාවිත වීමත් වෙනත් ශ්‍රේණිවල මෙන්ම වෙනත් විෂයන්වලදී පවා 'UNESCO' සංවිධානය පිළිබඳව තොරතුරු සාකච්ඡා වන බැවින් මෙම වචනය අපේක්ෂකයාට හුරුපුරුදු වීමත් මෙම වරණය තෝරා ගැනීමට හේතු වන්නට ඇත.

**ප්‍රශ්න අංක 23**

I පත්‍රයේ 23 ප්‍රශ්නය "රටක විදේශ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා බලපාන සාධක බටහිර ජාතීන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම ඇසුරින් විමර්ශනය කරයි." යන නිපුණතාව ආවරණය වන ලෙස සකස් කොට තිබේ. පෘතුගීසීන් හා යාපනේ පාලකයන් අතර නිරතුරුව ගැටුම් ඇතිවීම කෙරෙහි බලපෑ ප්‍රධානත ම හේතුව වූයේ කුමක්දැයි අසන ලද ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වන්නේ 'යාපනය රාජධානියේ කතෝලික ආගම ප්‍රචාරය කිරීමට එරෙහිව එහි පාලකයන්ගෙන් දැඩි විරෝධතා එල්ල වීමයි' යන පිළිතුරයි. අපේක්ෂකයන්ගෙන් නිවැරදි පිළිතුර ට යොමු වී තිබෙන්නේ 54.15%ක ප්‍රමාණයකි. එසේම අපේක්ෂකයන්ගෙන් 17.95%ක් පමණ ප්‍රමාණයක් 'මන්නාරම් මුහුදේ මුතු කිමිදීමේ කටයුතුවලදී යාපනේ පාලකයන්ගෙන් පෘතුගීසීන්ට බාධා එල්ලවීම' යන 2 වරණය තෝරාගෙන තිබේ. පෘතුගීසීන් යාපනය රාජ්‍ය කෙරෙහි අවධානය යොමු කිරීමට ආර්ථික හේතූන් ද බලපෑ බැවින් මන්නාරම් මුහුදේ මුතු කිමිදීමේ කටයුතුවලදී යාපනය පාලකයන්ගෙන් බාධා එල්ලවීම

හේතුවක් ලෙස සලකා එම වරණය තෝරා ගන්නට ඇතැයි සිතිය හැකිය. නමුත් මුතු කිමිදීමේ කටයුතු මෙම ගැටුම්වලට ප්‍රධාන හේතුවක් නොවන බොහෝ අපේක්ෂකයන් අවබෝධ කරගෙන නොමැති බව පැහැදිලි වේ.

**ප්‍රශ්න අංක 1**

I පත්‍රයේ පළමු ප්‍රශ්නය 'ඉතිහාසය ගොඩනැගීමට උපකාරීවන මූලාශ්‍රය අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කරයි' යන නිපුණතාව ආවරණය වන පරිදි සකස් කොට තිබේ. අතීත ශ්‍රී ලංකාවේ වෙළෙඳාම හා ලෝහ කර්මාන්තය පිළිබඳ හැදෑරීමේදී, වැදගත් මූලාශ්‍රය වන්නේ කුමක්දැයි අසන ලද ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වන්නේ, 'කාසි' යන 4 වරණයයි. එම ප්‍රශ්නයේ පහසුතාව 91.09%කි. වෙළෙඳාම හා ලෝහ කර්මාන්තය යන ක්ෂේත්‍රයන් දෙකට ම කාසිවල සෘජු සම්බන්ධතාවක් පැවතීම මෙම ප්‍රශ්නයෙහි ඉහළ පහසුතාවට හේතු වන්නට ඇතැයි සිතිය හැකිය.

**ප්‍රශ්න අංක 14**

I පත්‍රයේ දාහතරවන ප්‍රශ්නය 'ශ්‍රී ලාංකික අභිමානය ලොව පතළ කළ අපේ ආදී මුතුන් මිත්තන්ගේ අද්විතීය විද්‍යාත්මක නාමය හා තාක්ෂණය කුසලතා මහිමය අධ්‍යයනය කරමින් එවැනි කුසලතා වර්ධනය කර ගනියි' යන නිපුණතාවය හා සම්බන්ධ වේ. අතීතයේ නිවාස තැනීමේ තාක්ෂණය දැන සිටි බව තහවුරු කෙරෙන ප්‍රකාශය කුමක්දැයි අසන ලද ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වන්නේ, 'පොළොවට ලම්බාකාරව බිත්ති බැඳීම' යන්න 1 වරණයයි.එම ප්‍රශ්නයේ පහසුතාව 89.76%කි. ලබා දී තිබූ පිළිතුරු අතුරෙන් නිවාස තැනීම හා සම්බන්ධ තොරතුරු අතර වැදගත්ම කාර්යයක් වන්නේ බිත්ති බැඳීමයි. සෙසු පිළිතුරු නිවාස ඉදිකිරීමේ තාක්ෂණය හා සම්බන්ධ ප්‍රමුඛත ම කාරණා නොවීම බොහෝ අපේක්ෂකයන් එම වරණය පහසුවෙන් තෝරාගෙන තිබීම හේතුයක් විය හැකිය.

**ප්‍රශ්න අංක 12**

I පත්‍රයේ දොළොස්වන ප්‍රශ්නය "අතීත අත්දැකීම් ඇසුරින් වර්තමානයට ආදර්ශ ගනියි" යන නිපුණතාව හා සම්බන්ධ වේ. "වෙජ්ජසාලා" යනු කුමක්දැයි අසන ලද ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වන්නේ "ආරෝග්‍ය ශාලා" යන 1 වරණයයි. එම ප්‍රශ්නයේ පහසුතාවය 88.72%කි.10 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතේ අවස්ථා කිහිපයකදීම 'වෙජ්ජසාලා' හෙවත් රෝහල් පිළිබඳව සඳහන්වීම හා නිතර කතාබහට ලක්වීම මෙම ප්‍රශ්නයේ පහසුතව වැඩි වීමට හේතුවන්නට ඇතැයි සිතිය හැකිය.

# III කොටස

## 3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය

### 3.1 ඉතිහාසය II පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 03යි. මුළු ලකුණු 120යි.**

මෙය I,II, III වශයෙන් ප්‍රධාන කොටස් 03කින් යුක්ත ය.

**I කොටස**

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එහි (අ) හා (ආ) වශයෙන් කොටස් දෙකකි.

(අ) කොටස - සිතියම් ලකුණු කිරීම - ලකුණු 18යි.

(ආ) කොටස - ඓතිහාසික සිද්ධි ආශ්‍රිත කෙටි ප්‍රශ්න හතරකින් ද, පින්තූර ආශ්‍රිත කෙටි ප්‍රශ්න 8කින් ද, සමන්විත ය. ලකුණු 12යි.

**II කොටස**

ව්‍යුහගත අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 06කින් සමන්විත වේ. ඉන් 4කට පිළිතුරු සැපයිය යුතුය. මෙම ප්‍රශ්න 6 නිපුණතා මට්ටම්වලට වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාවට අනුකූලව පහත පාඩම් ඒකකවලින් සකස් කෙරේ.

10 ශ්‍රේණිය - 1,2,3,4,5,6,7,8,10

11 ශ්‍රේණිය - 2,3,4,5,6

**III කොටස**

ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 02කින් සමන්විත ය. ඉන් එකකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න දෙක නිපුණතා මට්ටම්වලට වෙන්කර ඇති කාලච්ඡේද සංඛ්‍යාවට අනුකූල ව පහත පාඩම් ඒකකවලින් සකස් කෙරේ.

10 ශ්‍රේණිය - 9

11 ශ්‍රේණිය - 1,7,8

අවසාන ලකුණු ගණනය කිරීම : I පත්‍රය = 80 ($40 \times 2$)

II පත්‍රය = 120


අවසාන ලකුණ = 200 / 2 = 100

**මූලාශ්‍රය :** අ.පො.ස (සා.පෙළ) විභාගය - 2016 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා මූලාකෘති ප්‍රශ්න 2016, ශ්‍රී.ලං.වි.දෙ.

## 3.2 II පත්‍රයේ විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.1**


II පත්‍රයේ එක් එක් ප්‍රශ්නවල පහසුතාව හා ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මූලාශ්‍රය : RD/16/4/AL, පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත , 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.2**


II පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය




මූලාශ්‍රය : RD/16/3/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024 ශ්‍රී.ලං.වි.දෙ

**ප්‍රස්තාරය 3.3**

පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය




මූලාශ්‍රය : RD/16/3/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024 ශ්‍රී.ලං.වි.දෙ

1,2,3 සහ 4 ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් වෙන් කළ ලකුණුවලින් 26%-50% අතර පරාසයේ ලකුණු ලබාගෙන ඇත.

5,7,8 සහ 9 ප්‍රශ්න සැලකූවිට වැඩිම අපේක්ෂකයන් ප්‍රතිශතයක් වෙන් කළ ලකුණුවලින් 0% - 25% අතර පරාසයේ ලකුණු ලබාගෙන ඇති බව පෙනේ.

6 ප්‍රශ්නය සඳහා වැඩිම අපේක්ෂකයන් ප්‍රතිශතයක් ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 76 - 100% පන්ති ප්‍රාන්තරයේ ලකුණු ලබා තිබීම විශේෂත්වයකි.

## 3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ

### 3.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර


**I කොටස**


**1. (අ)** (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

වළවේ ගඟ, මහවැලි ගඟ, නුරුළු වැව, රන්දෙණිගල ජලාශය, මින්නේරිය වැව, මිහින්තලේකන්ද, මාතොට, මහනුවර, පේදුරුතුඩුව, පුත්තලම, සීතාවක, කොඩ්ඩියාර් කොටුව (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

ජර්මනිය, ලිස්බන්, මලය අර්ධද්වීපය, මදුරාසිය, නාගසාකි, උතුරු මුහුද (ලකුණු 06 යි)


පේදුරුතුඩුව
N
මාතොට
කොට්ඩියාර් තොටුව
හුරුළු වැව
මින්නේරිය වැව
පුත්තලම
මහවැලි ගඟ
මහනුවර
රන්දෙනිගල ජලාශය
සීතාවක
මිනිහාගල්කන්ද


N
Indian Ocean
Africa

**(ආ)** (i) පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - අතීතයේ මැටි බඳුන් සැකසීම සඳහා භාවිත කළ සරල යන්ත්‍රය කුමක් ද?

*B* - අනුරාධපුර රාජධානියේ ප්‍රථම රජතුමා කවුරුන් ද?

*C* - ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය නිපදවන ලද්දේ කවුරුන් විසින් ද?

*D* - පළමුවන ලෝක යුද සමයේ දී ජර්මන් සබ්මැරීනයක් මගින් ගිල්වා දැමූ මගී නෞකාව කුමක් ද? (ලකුණු 04 යි)

***A.*** සකපෝරුව

***B.*** පණ්ඩුකාභය

***C.*** ජොහැන්ස් ගුටෙන්බර්ග්/ ගුටෙන්බර්ග්

***D.*** ලුසිටානියා ***(ලකුණු 1x4 = 4 යි)***

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. එය හමුවී ඇති ස්ථානය කුමක් ද?
3. එය භාවිත කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?
4. එය අයත් වූ ඓතිහාසික යුගය කුමක් ද?



*A*


(ලකුණු 04 යි)

***A***

1. මැටි ඔරු සුසාන/ මැටි ඔරුවක්
2. රංචාමඩම
3. අදාහනයට / භස්මාවශේෂ තැන්පත් කිරීමට/ මළසිරුරු පිළිස්සීම/ යාතු කර්ම චාරිත්‍ර පැවැත්වීම
4. පූර්ව ඓතිහාසික යුගය

***(ලකුණු 1x4 = 4 යි)***

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. එය පිහිටි නගරය කුමක් ද?
3. මෙම ගොඩනැගිල්ල භාවිත කරන ලද්දේ කුමක් සඳහා ද?
4. එය හා සම්බන්ධ විප්ලවය කුමක් ද?



*B*

(ලකුණු 04 යි)

***B***


1. බැස්ටිල් බන්ධනාගාරය/ බැස්ටීලය
2. පැරිස්/ පැරිසිය
3. සිර කඳවුරක් ලෙස/ සිරකරුවන් රඳවා තැබීමට
4. ප්‍රංශ විප්ලවය

***(ලකුණු 1x4 = 4 යි)***

### 3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.4**

ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





ප්‍රශ්න අංක 1 සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 30 කි. ඉන්
ලකුණු 0 - 7 ප්‍රාන්තරයේ 25% ක් ද,
ලකුණු 8 - 15 ප්‍රාන්තරයේ 35 % ක් ද,
ලකුණු 16 - 22 ප්‍රාන්තරයේ 27% ක් ද,
ලකුණු 23 - 30 ප්‍රාන්තරයේ 13% ක් ද,
වශයෙන් ලකුණු ලබාගෙන ඇත. ලකුණු 16 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 40% කි .

මූලාශ්‍රය : RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.5**

ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

I කොටසේ පළමු ප්‍රශ්නයේ (ආ) (i) කොටසේ A වැඩිම පහසුතාව සහිත ප්‍රශ්න අනුකොටස වේ. A අනුකොටසේ පහසුතාව 87%කි. එම කොටසෙහි ම C අනුකොටසෙහි පහසුතාව අඩු අගයක් ගෙන ඇත. එහි පහසුතාව 51%කි. එම කොටසේ ප්‍රශ්න සියල්ල ම (A,B,C,D) සඳහා පහසුතා දර්ශකය 0.51ට ඉහළ අගයක් ගැනීම කැපී පෙනේ.

(ආ) (i) A ප්‍රශ්නයෙන් විමසා තිබෙන්නේ ශ්‍රී ලංකාවේ අතීතයේ මැටි බඳුන් සැකසූ ආකාරය පිළිබඳවයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිට ම විවිධ විෂයන්වල මැටි කර්මාන්තය පිළිබඳ අපේක්ෂකයන්ට අධ්‍යයනය කිරීමට අවස්ථාවන් ලැබීම මෙම ඉහළ සාධනයට හේතු වන්නට ඇත.

පහසුතාව අඩුම A (i) C ප්‍රශ්නයෙන් විමසා තිබෙන්නේ ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය නිපදවන ලද්දේ කවුරුන් විසින් ද යන්නයි. 10 ශ්‍රේණියේ පාඩමෙහි යුරෝපා පුනරුද යුගයේ නව සොයාගැනීම් පිළිබඳව යම් සමානකම් දක්වන යුරෝපීය පුද්ගල නාම රැසක් අන්තර්ගත වී ඇත. මෙම නාමයන් නිවැරදිව හඳුනා නොගැනීම මෙම ප්‍රශ්නයෙහි පහසුතාව අඩු වීමට හේතු වූවා විය හැකිය.

පළමු ප්‍රශ්නයේ (අ) (i) හා (ii) කොටස් වන සිතියම් ලකුණු කිරීම සම්බන්ධ ප්‍රශ්නය සඳහා ද අඩු පහසුතා අගයක් ඇත. ශ්‍රී ලංකා සිතියමට අදාළ ප්‍රශ්නය සඳහා පහසුතාව 35%කි. ලෝක සිතියමට අදාළ ප්‍රශ්නය සඳහා පහසුතාව 30%කි. සිතියම් ලකුණු කිරීමට සම්බන්ධ වූ නිශ්චිත මාර්ගෝපදේශයක් නොතිබීමත් පන්ති කාමරයේ ප්‍රමාණවත් ලෙස ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිරීමට අවස්ථාවක් නොලැබීමත් මෙයට හේතු විය හැකිය.

ඒකක අවසානයේදී අදාළ ඓතිහාසික ස්ථාන, සිතියම්වල ලකුණු කිරීමේ ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කිරීමත් ඒ සඳහා නිවැරදි සිතියම් භාවිතයට ගැනීමත්, මගින් මෙම ඉගෙනුම් දුෂ්කරතා මඟ හරවා ගත හැකිය.

### 3.3.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර

2. (i) පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප භාවිත කළ රජවරු *A*, *B* හා *C* යටතේ **අනුපිළිවෙළින්** දක්වන්න.
   *A* - දේවත්ව
   *B* - පර්වතරාජ
   *C* - චක්‍රවර්තී (ලකුණු 03 යි)

   (ii) අතීතයේ රාජ්‍ය උරුමය හිමි වූ ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

   (iii) පැරණි රජවරුන් විසින් තමාගෙන් රටවැසියාට ඉටුවිය යුතු යැයි සැලකූ යුතුකම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

   (iv) පළමුවන විජයබාහු රජතුමාගෙන් සිදු වූ සේවාව කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)**

A. මහසෙන්
B. පළමුවන කාශ්‍යප/ සීගිරි කාශ්‍යප
C. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල/ නිශ්ශංකමල්ල

***(ලකුණු 1 × 3 = 03 යි)***

**(ii)**

- පියාගෙන් පුතාට
- සහෝදරයාගෙන් සහෝදරයාට
- රජ බිසවගේ සහෝදරයාට
- රජුගේ සහෝදරියගේ පුත්‍රයාට

***(ලකුණු 2 x 2 = 04 යි)***

**(iii)**

- ආර්ථිකය සංවර්ධනය කිරීම
- රටේ ජනතාවට ආරක්ෂාව සැපයීම
- රටවැසියාගේ ආධ්‍යාත්මික සුවය සැපයීම/ ආගමික කටයුතු
- සමාජ සුභසාධන කටයුතු

***(ලකුණු 2 + 3 = 05 යි)***

**(iv)**


- චෝල පාලනයෙන් රට නිදහස් කර ගැනීම
- බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
- අගනුවර පොළොන්නරුවට ගෙන ඒම
- වාර්ගික සහජීවනයෙන් යුතුව පාලනය කිරීම
- රටේ ආරක්ෂාව සඳහා විදේශ සම්බන්ධතා ඇති කර ගැනීම

***(ලකුණු 3 + 3 = 06 යි)***

### 3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.6**

ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





ප්‍රශ්න අංක 2 සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 18 කි. ඉන්,
ලකුණු 0 - 4 ප්‍රාන්තරයේ 15% ක් ද,
ලකුණු 5 - 9 ප්‍රාන්තරයේ 30% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 25% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 30% ක් ද,
වශයෙන් ලකුණු ලබාගෙන ඇත. ලකුණු 0 - 4 ප්‍රාන්තරයෙන් ලකුණු ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 15% කි. අපේක්ෂකයන්ගෙන් 55% ක් ලකුණු 10 හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගෙන තිබේ.

මූලාශ්‍රය : RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.7**

ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත ,2024 ශ්‍රී. ලං. වි. දෙ.

2 ප්‍රශ්නය 10 ශ්‍රේණිය, ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම යන පාඩමෙන් සකසා ඇත. දෙවන ප්‍රශ්නය අනු කොටස් හතරකින් සමන්විතය.

මෙම ප්‍රශ්නයේ පහසුතාව වැඩිම ප්‍රශ්න අනු කොටස වන්නේ 2.ii (අතීතයේ රාජ්‍ය උරුමය හිමි වූ ආකාර දෙකක් සඳහන් කරන්න). වේ.මෙම ප්‍රශ්න අනු කොටසෙහි පහසුතාව 81%කි. රාජාණ්ඩු පාලනය හා සම්බන්ධ නිතර කතාබහට ලක්වන මෙන්ම ඉතා සරල වූ ප්‍රකට විෂය කරුණක් මුල් කර ගනිමින් කෙටි පිළිතුරු දෙකක් විමසා සිටීම, මෙම ප්‍රශ්නයෙහි සාධනය වැඩි වීමට හේතු වන්නට ඇතැයි සිතිය හැකිය.

මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු ම ප්‍රශ්න අනු කොටස වන්නේ, 2.iv ය. (පළමුවන විජයබාහු රජතුමාගෙන් සිදු වූ සේවාව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න). මෙම අනු කොටසෙහි පහසුතාව 43%කි. රජවරුන් පිළිබඳව හා ඔවුන්ගේ කාර්යභාරයන් පිළිබඳව ප්‍රධාන කරුණු යටතේ තොරතුරු ඉදිරිපත් කිරීමට, අපේක්ෂකයා තුළ නිරවුල් හා පැහැදිලි අවබෝධයක් නොතිබීමත්, යම් කරුණක් සම්බන්ධ ව විස්තරාත්මක ව තොරතුරු දැක්වීමට තිබෙන දුර්වලතාවයත්, පහසුතා අඩු වීමට හේතු විය හැකිය.

ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේදී අදාළ විෂය කරුණු වෙන් කොට, පහසුවෙන් මතක තබාගත හැකි සරල ක්‍රම භාවිත කිරීම මෙන්ම අතීතයේ පැවැති ශ්‍රී විභූතිය මෙන්ම පාලකයන්ගේ සේවාවන් ඉස්මතුවන ලෙස සකස් කරන ලද වාර්තා වැඩසටහන්, වගු සටහන්, ගැලීම් සටහන් හා විවිධ විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීම මගින් සිසුන් තුළ අවබෝධය තහවුරු කළ හැකිය.

### 3.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

| | |
|---|---|
| 3. (i) අතීත ශ්‍රී ලංකාවේ රජවරු සම්බන්ධතා පවත්වා ගත් විදේශ රටවල් **තුනක්** නම් කරන්න. | (ලකුණු 03 යි) |
| (ii) අතීත රජවරු විදේශ සබඳතා පවත්වා ගත් ආකාර **දෙකක්** දක්වන්න. | (ලකුණු 04 යි) |
| (iii) අතීත ශ්‍රී ලංකා සමාජයේ විවිධ ආගම් පැවති බව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. | (ලකුණු 05 යි) |
| (iv) අතීත ශ්‍රී ලංකා සමාජයේ විවිධ වෘත්තිකයින් සිටි බව නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

**(i)** ඉන්දියාව (චේර රාජ්‍ය/ කාලිංග/ පල්ලව පාණ්ඩ්‍යදේශය) අරාබිය/ රෝමානු දේශය (රෝමය) චීනය/ කාම්බෝජය/ බුරුමය/ ග්‍රීසිය/ ඇබිසීනියාව (ඉතියෝපියාව)/ පර්සියාව

***(ලකුණු 1 x 3= 03 යි)***

**(ii)**

- වෙළෙඳ සම්බන්ධතා
- ආගමික සම්බන්ධතා (සංස්කෘතික)
- දේශපාලන සම්බන්ධතා
- මිත්‍ර සම්බන්ධතා
- විවාහ සම්බන්ධතා
- තානාපති සම්බන්ධතා

***(ලකුණු 2 x 2= 04 යි)***

**(iii)**

- බුදුදහම ප්‍රධාන ආගම ලෙස පැවැතීම
- හින්දු ආගම පැවැතීම
- ඉස්ලාම් ආගමික අදහස් පැවැතීම

***(ලකුණු 2 + 3= 05යි)***

**(iv)**


- ගුරුවරු
- වෛද්‍යවරු
- නීති විශාරදයින්
- විවිධ ශිල්පීන් (නැට්ටුවන්, සිත්තරුන්, කවියන්)
- විවිධ කාර්මිකයින් (කම්මල්කරු, රන්කරු, කැටයම් ශිල්පීන්, කුම්භකාරවරු)
- වෙළෙඳුන්

***(ලකුණු 3 + 3 = 06යි)***

### 3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය** 3.8

ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





ප්‍රශ්න අංක 3 සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 18කි . ඉන්
ලකුණු 0 - 4 ප්‍රාන්තරයේ 21% ක් ද,
ලකුණු 5 - 9 ප්‍රාන්තරයේ 31 % ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 25% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 24% ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
ලකුණු 0 - 4 ප්‍රාන්තරය ලකුණු ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 21%කි.
අපේක්ෂකයන්ගෙන් 49%ක් පමණක් ලකුණු 10 හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගෙන තිබේ.

මූලාශ්‍රය : RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024 ශ්‍රී. ලං. වි. දෙ

**ප්‍රස්තාරය 3.9**

ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024 ශ්‍රී. ලං. වි. දෙ.

3 ප්‍රශ්නය 10 ශ්‍රේණිය 4වන පාඩම ශ්‍රී ලංකාවේ පැරණි සමාජය යන පාඩමෙන් සකසා ඇත. මෙම ප්‍රශ්නය අනු කොටස් හතරකින් සමන්විතය. මෙම ප්‍රශ්නයේ පහසුතාව වැඩිම ප්‍රශ්න අනු කොටස් වන්නේ 3.(I)(අතීත ශ්‍රී ලංකාවේ රජවරු සම්බන්ධතා පවත්වාගත් විදේශ රටවල් තුනක් නම් කරන්න) සහ 3.(II)(අතීත රජවරු විදේශ සබඳතා පවත්වාගත් ආකාර දෙකක් දක්වන්න) වේ.මෙම ප්‍රශ්න අනු කොටස් දෙකෙහි ම පහසුතාව 70%කි. දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන සෑම අංශයකින් ම තොරතුරු ගෙනහැර දක්වමින් පිළිතුරු සැපයීමට හැකිවීමත් 10 ශ්‍රේණිය පෙළපොතේ අවස්ථා කිහිපයකදී ම මීට අදාළ කරුණු සාකච්ඡා වීමත් මෙම වැඩි සාධනයට හේතු වන්නට ඇත.

පහසුතාව අඩුම ප්‍රශ්න අනුකොටස වන්නේ, 3 (III) (අතීත ශ්‍රී ලංකා සමාජයේ විවිධ ආගම් පැවැති බවට කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.) වේ. මෙහි පහසුතාව 39%කි. අතීතයේ පැවැති ආගම් සම්බන්ධ විෂය කරුණු පිළිබඳව ඇතැම් අපේක්ෂකයන් තුළ නිරවුල් අවබෝධයක් නොතිබීම ද පහසුතාව අඩු වීමට හේතු විය හැකිය.

තව ද පෙළ පොත තුළ දක්වා ඇති විවිධ තොරතුරු අනු මාතෘකාවලට වෙන්කොට උදාහරණ සහිතව විධිමත් ව ගොනු ගතකොට ඉගැන්වීම හා ප්‍රධාන විෂය කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගැනීමත් මගින් සාර්ථක ප්‍රතිඵල කරා ළඟාවිය හැකිය.

### 3.3.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර

**4.** (i) පහත සඳහන් රාජධානිවල ආරම්භක පාලකයින් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා ඔවුන්ගේ නම් *A*, *B* හා *C* යටතේ **අනුපිළිවෙළින්** ලියන්න.

*A* - දඹදෙණිය

*B* - කුරුණෑගල

*C* - කෝට්ටේ

(II බුවනෙකබාහු, III විජයබාහු, VI පරාක්‍රමබාහු, III වික්‍රමබාහු) (ලකුණු 03 යි)

(ii) දෙවන නාගරීකරණ අවධියේ රචනා වූ සංදේශ කාව්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ අවධියේ පැවැති වෙළෙඳාමේ ස්වභාවය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ අවධියේ ගෘහනිර්මාණ ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)**

A. III විජයබාහු

B. II බුවනෙකබාහු

C. VI පරාක්‍රමබාහු

***(ලකුණු 1 × 3 = 03යි)***

**(ii)** මයූර/ තිසර/ හංස/ පරවි/ ගිරා/ සැලළිහිණි /කෝකිල

***(ලකුණු 1 × 4 = 04යි)***

**(iii)**

- කුරුඳු ප්‍රධාන වෙළෙඳ බෝගයක් බවට පත් වීම
- අපනයන කළ භෝග හා ද්‍රව්‍ය
- ආනයනික ද්‍රව්‍ය
- අභ්‍යන්තර වෙළෙඳාම
- වෙළෙඳ වීදි හා කඩ පැවතීම
- විදේශ වෙළෙඳාමේදී වැදගත් වූ වරායන්
- විදේශ වෙළෙඳාම රජුගේ ඒකාධිකාරය වීම

***(ලකුණු 2 + 3 = 05යි)***

**(iv)**


- දකුණු ඉන්දීය ගෘහ නිර්මාණවල ආභාසය ලැබීම
- පාණ්ඩ්‍ය හා කාම්බෝජ ආභාසය
- පිළිමගෙයට සම්බන්ධකර දේවාල ඉදි කිරීම
- ලී කැටයම් ගෘහ නිර්මාණ සඳහා භාවිත කිරීම
- ඇවමය වහල නිර්මාණය

***(ලකුණු 3 + 3 = 06 යි)***

### 3.3.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය** 3.10

ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





ප්‍රශ්න අංක 4 සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 18කි.
ලකුණු 0 - 4 ප්‍රාන්තරයේ 37% ක් ද,
ලකුණු 5 - 9 ප්‍රාන්තරයේ 43% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 12% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 8% ක් ද,
වශයෙන් ලකුණු ලබාගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 80%ක් 9ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබාගෙන ඇත. ලකුණු 14 ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 8% කි.

මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.11**

ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

4 ප්‍රශ්නය 10 ශ්‍රේණිය 'වියළි කලාපයේ පැරණි නගර පිරිහීම හා නිරිත දිග නව රාජධානි බිහි වීම' යන පාඩමෙන් සකසා තිබේ.

හතරවන ප්‍රශ්නය අනුකොටස් හතරකින් සමන්විත වේ. මෙම ප්‍රශ්නයේ වැඩිම පහසුතාව වැඩිම සහිත ප්‍රශ්න අනු කොටස වන්නේ 4.ii (දෙවන නාගරීකරණ අවධියේ රචනා වූ සංදේශ කාව්‍ය හතරක් නම් කරන්න) වේ. මෙම ප්‍රශ්න අනු කොටසෙහි පහසුතාව 67%කි. ඒ අනුව ප්‍රශ්නයෙන් විමසා තිබෙන දෙවන නාගරීකරණ සමයේ රචනා වූ සාහිත්‍ය කෘති පිළිබඳවත් ඒවා වර්ග කොට දැක්වීම පිළිබඳවත් බොහෝ අපේක්ෂකයන් තුළ ප්‍රමාණවත් අවබෝධයක් පැවති බව පැහැදිලි වේ.

පහසුතාව අඩු ම ප්‍රශ්න අනු කොටස 4.iv (දෙවන නාගරීකරණ අවධියේ ගෘහ නිර්මාණ ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ නිදසුන් තුනක් ඇසුරෙන් පහැදිලි කරන්න) වේ. පහසුතාව 13%කි. දෙවන නාගරීකරණ අවධියේ ගෘහ නිර්මාණ ක්ෂේත්‍රයේ විශේෂ ලක්ෂණ හතරවන අනු කොටසින් විමසා ඇති අතර අපේක්ෂකයන්ට එය අභියෝගාත්මක වූ බව පෙනේ. රජරට ශිෂ්ටාචාරය දෙවන නාගරීකරණ සමය සහ පුනරුදය යන මාතෘකාවල දී ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව සාකච්ඡා කරන බැවින් අපේක්ෂකයන් හට මෙම විෂය කරුණු වෙන වෙනම මතකයේ තබා ගැනීමේ අපහසුතාවය අඩු සාධනයට හේතුවිය හැකි ය.

පැරණි ගෘහ නිර්මාණ ක්‍රම ඇතුළත් වීඩියෝ දර්ශන, පින්තූර ආදිය භාවිත කිරීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සාර්ථක කරගැනීමට හැකි වේ.

### 3.3.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර

| | | |
|---|---|---|
| 5. (i) | 18 වන සියවසේ යුරෝපයේ ඉහළ ඉල්ලුමක් තිබූ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ද්‍රව්‍ය **තුනක්** නම් කරන්න. | (ලකුණු 03 යි) |
| (ii) | බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක **දෙකක්** ලියන්න. | (ලකුණු 04 යි) |
| (iii) | 1818 දී උඩරටියන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව නැගී සිටීමට තුඩුදුන් හේතු **දෙකක්** විස්තර කරන්න. | (ලකුණු 05 යි) |
| (iv) | 1818 නිදහස් අරගලය අසාර්ථක වීමට තුඩුදුන් හේතු **තුනක්** පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

**(i)** කුරුඳු/ ගම්මිරිස්/ එනසාල්/ කරාබුනැටි/ මුතු/ මැණික්/ ඇත්දළ

***(ලකුණු 1 × 3 = 3 යි)***

**(ii)**

- උඩරට ස්වාධීන රාජ්‍යයක් තිබීම ඉංග්‍රීසි පාලනයට තර්ජනයක් ලෙස සැලකීම
- වෙරළබඩ ප්‍රදේශ හා අභ්‍යන්තර දේශ සීමා ආරක්ෂා කිරීමට විශාල වියදමක් දැරීමට සිදු වීම
- මුහුදුබඩ ප්‍රදේශවල ඇතිවන කැරළිවලදී උඩරට රජු කැරලිකරුවන්ට ආධාර දීම
- කොළඹ සිට ත්‍රිකුණාමලය දක්වා උඩරට හරහා ගොඩබිම් මාර්ගයක් ඉදිකිරීමේ අවශ්‍යතාව
- උඩරට රජු ඉංග්‍රීසින්ට විරුද්ධව වෙනත් යුරෝපීය ජාතිකයන්ගේ (ප්‍රංශ) ආධාර ලබා ගැනීම සිදු කරතියි සැකය ඇති වීම
- කඩවත් බදුවලින් නිදහස් වීමට ඉංග්‍රීසින්ට අවශ්‍ය වීම

***(ලකුණු 2 × 2 = 4 යි)***

**(iii)**

- නිදහස අහිමි වීම හා රජෙකු නැතිවීම පිළිබඳ පසුතැවිල්ල
- ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳව ගැටලු මතුවීම
- උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම
- උඩරට ප්‍රවාහනය කටයුතු භාර වූ මඩිගේ මොහන්දිරම් තනතුරට මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම
- උඩරට ගිවිසුමේ වගන්ති උල්ලංඝනය කිරීම

***(ලකුණු 2 + 3 = 05 යි)***

**(iv)**


- ඉංග්‍රීසින් අනුගමනය කළ දැඩි මර්දනකාරී ප්‍රතිපත්ති
- දීර්ඝකාලීන සටනට අවශ්‍ය අවි ආයුධ හා සම්පත් උඩරැටියන්ට නොතිබීම
- සටනේ අසංවිධානාත්මක ස්වරූපය
- රජු ලෙස ඉදිරිපත් වූ තැනැත්තාට රාජ්‍ය උරුමයක් නැති බව හෙළිවීම
- බ්‍රිතාන්‍යයන්ගේ යුධ ශක්තිය
- ඇතැම් රදළ ප්‍රධානීන් ඉංග්‍රීසින්ට සහය දැක්වීම
- සිංහල නායකයින් අතර මතභේද ඇතිවීම
- මදුරාසියෙන් අතිරේක හමුදා ඉංග්‍රීසින්ට ලැබීම
- දළදාවහන්සේගේ භාරකාරත්වය ඉංග්‍රීසින් සතු කර ගැනීම

*(ලකුණු 3 + 3 = 06 යි)*

### 3.3.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.12**

ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





ප්‍රශ්න අංක 5 සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 18 කි. ඉන්
ලකුණු 0 - 4 ප්‍රාන්තරයේ 39% ක් ද,
ලකුණු 5 - 9 ප්‍රාන්තරයේ 24% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 16% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 21% ක් ද,
වශයෙන් ලකුණු ලබාගෙන ඇත.
අපේක්ෂකයන්ගෙන් 63%ක් ලකුණු 9 හෝ ඊට අඩුවෙන් ලබාගෙන තිබේ.

මූලාශ්‍රය : RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත ,2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.13**

ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

5 ප්‍රශ්නය 11 ශ්‍රේණිය ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම යන පාඩමෙන් සකසා ඇත.

පස්වන ප්‍රශ්නය අනුකොටස් හතරකින් සමන්විතය. ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 46%කි. පහසුතාව වැඩි ම ප්‍රශ්න අනු කොටස 5(i)(18වන සියවසේ යුරෝපයේ ඉහළ ඉල්ලුමක් තිබූ ශ්‍රී ලංකාවේ වෙළඳ ද්‍රව්‍ය තුනක් නම් කරන්න.) වේ. මෙම අනු කොටසෙහි පහසුතාව 62%කි. විෂය නිර්දේශයට අදාළ මෙන්ම සාමාන්‍ය සමාජීය දැනුමට ද අදාළ විදේශ වෙළඳාම් හා සම්බන්ධ සරල කරුණු තුනක් විමසා තිබීම ඉහළ සාධනයට හේතු වන්නට ඇතැයි සිතිය හැකිය.

මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු ම සහිත ප්‍රශ්න අනුකොටස වන්නේ 5(ii) (බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක දෙකක් ලියන්න) වේ. මෙම අනු කොටසෙහි පහසුතාව 27%කි. බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක පිළිබඳව බොහෝ අපේක්ෂකයන් තුළ නිරවුල් අවබෝධයක් නොතිබීම අඩු පහසුතාවට හේතු විය හැකිය. එනම් බ්‍රිතාන්‍යයන් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු සහ බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක පැහැදිලිව වෙන්කොට හඳුනා ගැනීමට අපේක්ෂකයා අපොහොසත් වීම පහසුතාව අඩු වීමට හේතු වන්නට ඇත.

ඉගෙනුම් ආධාරක බහු මාධ්‍ය උපකරණ භාවිත කරමින් විෂය කරුණු පහසුවෙන් මතක තබා ගැනීමට හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය.

## 3.3.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර

| | |
|---|---|
| 6. (i) හින්දු ආගමික පුනරුදයේ නායකයින් **තිදෙනෙකු** නම් කරන්න. | (ලකුණු 03 යි) |
| (ii) ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා එහි නායකයින් ගත් ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. | (ලකුණු 04 යි) |
| (iii) ක්‍රිස්තියානි මිෂනාරිවරුන් ශ්‍රී ලංකාවේ තම ආගම ප්‍රචාරය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. | (ලකුණු 05 යි) |
| (iv) බෞද්ධාගමික පුනරුදය උදෙසා එහි නායකයින් අනුගමනය කරන ලද උපායමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

**(i)**

- ආරුමුග නාවලර් තුමා
- පොන්නම්බලම් රාමනාදන්
- පොන්නම්බලම් අරුණාචලම්

*(ලකුණු 1×3 = 03යි)*

**(ii)**

- "මුස්ලිම් **නෙයිසන්** පුවත්පත ආරම්භ කිරීම
- කොළඹ සහිරා විද්‍යාලය ඇතුළු පාසල් පිහිටුවීම
- මුස්ලිම් බාලිකා පාසල් ආරම්භ කිරීම
- ඉංග්‍රීසි හා අරාබි භාෂාවෙන් අධ්‍යාපනය සඳහා උනන්දු කර වීම
- 'මද්රාසා' නම් ඉස්ලාම් ආගමික පාසල් ප්‍රතිසංවිධානය කිරීම
- ඉස්ලාම් අධ්‍යාපන සමිති නම් සංවිධානයක් ඇරඹීම

*(ලකුණු 2 × 2 = 04යි)*

**(iii)**

- ලේඛණ මාධ්‍ය යොදා ගැනීම
- දේශන මාධ්‍ය යොදා ගැනීම
- අධ්‍යාපනය යොදා ගැනීම
- විවිධ සමාජ සේවා කටයුතු යොදා ගැනීම

*(ලකුණු 2 +3 = 05යි)*

**(iv)**


- බෞද්ධ පිරිවෙන් පිහිටුවීම
- මුද්‍රණාල පිහිටුවීම හා විවිධ ප්‍රකාශන නිකුත් කිරීම
- සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය බෞද්ධ පාසල් පිහිටුවීම
- ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම
- දේශානුරාගය හා ජාතයාලය වර්ධනය කිරීමේ ව්‍යාපාර ආරම්භ කිරීම
- බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමේ කටයුතු ආරම්භ කිරීම
- අමද්‍යප ව්‍යාපාරය
- ඉරුදින දහම් පාසල් ඇරඹීම, බෞද්ධ කොඩිය නිර්මාණය, වෙසක් පෝය රජයේ නිවාඩු දිනයක් කිරීම ආදී කටයුතු

*(ලකුණු 3 +3 = 06යි)*

### 3.3.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය** 3.14

ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





ප්‍රශ්න අංක 6 සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 18 කි. ඉන්
ලකුණු 0 - 4 ප්‍රාන්තරයේ 16 % ක් ද,
ලකුණු 5 - 9 ප්‍රාන්තරයේ 22 % ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 20 % ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 42 % ක් ද,
මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී, අපේක්ෂකයන්ගෙන් 62%ක් ලකුණු 10 හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගෙන තිබේ.

මූලාශ්‍රය **:** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.15**

ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය **:** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

6 ප්‍රශ්නය 11 ශ්‍රේණිය ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය යන පාඩමෙන් සකසා ඇත. හයවන ප්‍රශ්නය අනුකොටස් හතරකින් සමන්විතය. මෙම ප්‍රශ්නයේ පහසුතාව වැඩි ම ප්‍රශ්න අනුකොටස වන්නේ 6 (i)(හින්දු ආගමික පුනරුදයේ නායකයින් තිදෙනෙකු නම් කරන්න)වේ. පහසුතා දර්ශකය 0.78කි.

11ශ්‍රේණිය පෙළපොතේ ජාතික පුනරුද ව්‍යාපාරයේ නායකයන් තිදෙනෙකු පමණක් විමසා තිබීමෙන් අපේක්ෂකයාට පහසුවෙන් ප්‍රශ්නය අවබෝධ කර ගැනීමට හැකිවීමත් වෙනත් ශ්‍රේණිවල විවිධ විෂයයන් ඔස්සේ මෙම නායකයන් පිළිබඳව අවබෝධයක් තිබීමත් පහසුතාව වැඩි වීමට හේතු වූ බව සිතිය හැකිය.

6 ප්‍රශ්නයේ, ii,iii සහ iv අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 67%, 58%, 62%ක් වේ. මෙම ප්‍රශ්න අනු කොටස්වල ද පහසුතා දර්ශකය සතුටුදායක මට්ටමක පවතින බැවින් මෙම ප්‍රශ්නයට අදාළ විෂය කරුණු, පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂකයන් තුළ පැවැති බව සිතිය හැකිය. එසේම 11 ශ්‍රේණිය පෙළපොතේ තිබෙන පාඩම් අතුරෙන් මෙරට ජන සමාජය හා සමීප තොරතුරු ඇතුළත් පාඩමක් ඇසුරෙන් මෙම ප්‍රශ්නය සකස්කොට තිබීම පහසුතාව වැඩිවීමට හේතුවක් ලෙස දැක්විය හැකිය.

### 3.3.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර

7. (i) නිදහස ලැබීමට පෙර ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද ගොවි ජනපද **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ගොවි ජනපද පිහිටුවීමේ අරමුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) ගොවි ජනපද පිහිටුවීමේ දී මුහුණදුන් අභියෝග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහවැලි සංවර්ධන ව්‍යාපාරය බහුකාර්ය යෝජනා ක්‍රමයක් ලෙස සැලකීමට හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)** මින්නේරිය/ කාගම/ නාච්චදූව/ බෙරගම/ මිනිපේ/ පරාක්‍රම සමුද්‍රය/ සංගිලි කනදරාව/ උන්නිච්චායි/ රිදීබැදි ඇල

*(ලකුණු 1 × 3 = 03යි)*

**(ii)**

- තෙත් කලාපයේ ඉහළ යමින් පවතින ජනගහන තදබදය හා රැකියා හිඟය අඩු කිරීම
- රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම
- වියළි කලාපයේ පැරණි වැව් හා වාරිමාර්ග අළුත්වැඩියා කිරීම හා ඉඩම් ආර්ථික සංවර්ධනයට යොදා ගැනීම
- තෙත් කලාපයේ පවතින ඉඩම් හිඟය අවම කර ඉඩම් හිමි තෘප්තිමත් ගොවි පරපුරක් නිර්මාණ කිරීම

*(ලකුණු 2 × 2 = 04යි)*

....

**(iii)**

- තෙත් කාලාපයේ ජනතාව තෝරා ගෙන වියළි කාලාපයේ පදිංචි කරවීම
- කලක් වනගතව පැවති බිම් කෘෂි කර්මයට සුදුසු පරිදි සකස් කරවීම හා වාරිමාර්ග පහසුකම් සැලසීම
- ප්‍රථම අස්වැන්න නෙලන තෙක් ජනපද වාසීන්ට ආධාර මුදලක් ලබා දීම
- නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා අලෙවි සංවර්ධන සේවා පිහිටුවීම
- ජනතාවගේ සෞඛ්‍ය අධ්‍යාපනය ඇතුළු පහසුකම් ඇති කිරීම

*(ලකුණු 2 + 3 = 05යි)*


**(iv)**

- එක් අරමුණකට වඩා වැඩි කාර්යයන් රැසක් ඉටු කර ගත හැකි යෝජනා ක්‍රමයක් වීම.
    - ➢ කෘෂි බිම් ප්‍රමාණය වැඩි කර ගත හැකි වීම
    - ➢ ජල විදුලි බල නිෂ්පාදනය සිදු කිරීම
    - ➢ නව ජනාවාස ඇති කිරීම
    - ➢ ආහාර බෝග ව්‍යාප්ත කිරීම
    - ➢ සුළු අපනයන බෝග ව්‍යාප්ත කිරීම
    - ➢ ගංවතුර පාලනය සිදු කිරීම
    - ➢ මිරිදිය මසුන් බෝ කිරීම
    - ➢ විවිධ සේවා හා කර්මාන්ත ආරම්භ කිරීම
    - ➢ නව රැකියා අවස්ථා බිහි කර ගත හැකි වීම *(ලකුණු 3 + 3 = 06යි)*

**3.3.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය**

**ප්‍රස්තාරය** 3.16

ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




ප්‍රශ්න අංක 7 සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 18 කි. ඉන්

ලකුණු 0 - 4 ප්‍රාන්තරයේ 50 % ක් ද,

ලකුණු 5 - 9 ප්‍රාන්තරයේ 17 % ක් ද,

ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 12 % ක් ද,


ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 21 % ක් ද,

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 67%ක් ලබාගෙන තිබෙන්නේ ලකුණු 09 ක් හෝ ඊට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.17**

ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

7 ප්‍රශ්නය 11 ශ්‍රේණියේ ශ්‍රී ලංකාවට නිදහස ලැබීම යන පාඩමෙන් සකසා ඇත. හත්වන ප්‍රශ්නය අනුකොටස් හතරකින් සමන්විතය. මෙම ප්‍රශ්නයේ පහසුතාව වැඩිම අනුකොටස වන්නේ 7(ii) (ගොවි ජනපද පිහිටුවීමේ අරමුණු දෙකක් ලියන්න)වේ. එහි පහසුතාව 48%කි. නිදහසට පෙර හා පසු ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව අපේක්ෂකයා තුළ පවතින අවබෝධය සතුටුදායක මට්ටමක නොපවතින බව මින් පැහැදිලිය.

පහසුතාව අඩුම ප්‍රශ්න අනු කොටස 7.i (නිදහස ලැබීමට පෙර ලංකාවේ පිහිටුවන ලද ජනපද තුනක් නම් කරන්න)වේ . එහි පහසුතාව 21%කි. නිදහසට පෙර හා පසු පිහිට වූ ගොවි ජනපද නිවැරදිව වෙන් කොට මතකයේ තබා ගැනීමේ ප්‍රධාන දුර්වලතාව පහසුතාව අඩු වීමට හේතු වන්නට ඇත.

7.iii. ගොවිජනපද පිහිටුවීමේ දී මුහුණදෙන අභියෝග දෙකක් විස්තර කරන්න. (පහසුතාව 35%කි.)
7.iv.මහවැලි සංවර්ධන ව්‍යාපාරය බහුකාර්ය යෝජනා ක්‍රමයක් ලෙස සැලකීමට හේතු තුනක් ලියන්න.(පහසුතාව 32%කි.)

ඉහත ප්‍රශ්න අනුකොටස් දෙකෙහි ම පහසුතාව 35%ක් හෝ ඊට අඩු වේ. ශ්‍රී ලංකාවේ ගොවිජනපද ව්‍යාපාර හා මහවැලි සංවර්ධනය ව්‍යාපෘතිය පිළිබඳව අපේක්ෂකයා තුළ පැවැති අඩු අවබෝධය අඩු පහසුතා දර්ශකයට හේතු වී ඇත. 7 වන ප්‍රශ්නයේ සියලු ප්‍රශ්න අනුකොටස්වල පහසුතා දර්ශකය 0.50 ට වඩා අඩු වේ. ඒ අනුව නිදහසට පෙර හා පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම බොහෝ අපේක්ෂකයන්ට අභියෝගාත්මක වූ බව පෙනේ.

නිදහසට පෙර හා පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව දැනුම වර්ධනය කරගැනීම සඳහා ඒ පිළිබඳව ව්‍යාපෘති,අත්තතා සංචාර,කෙටි චිත්‍රපටි යොදාගනිමින් සිසුන් සමග ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සිදු කිරීම වැදගත් වේ.

### 3.3.15 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර

8. (i) යුරෝපයේ පුනරුද සමයේ විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කළ තැනැත්තන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඉහත 8 (i) ට අදාළව ඔබ නම් කළ තැනැත්තන් දෙදෙනෙකු ඉදිරිපත් කළ නව මත **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පුනරුද සමයේ කලාශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පුනරුදයේ ප්‍රතිඵල ලෙස යුරෝපයේ ඇති වූ දේශපාලන හා ආර්ථික වෙනස්වීම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)**

- නිකලස් කොපර්නිකස් / කොපර්නිකස්
- ජොහැන්නස් කෙප්ලර් / කෙප්ලර්
- ගැලිලියෝ ගැලීලි / ගැලීලි
- අයිසැක් නිව්ටන් / නිව්ටන්

*(ලකුණු 1 × 3 = 03යි)*

**(ii)**

- නිකලස් කොපර්නිකස්
  - පෘතුවිය ගෝලාකාර බව
  - ග්‍රහලෝක සූර්යා වටා පරිභ්‍රමණය වීම
- ජොහැන්නස් කෙප්ලර්
  - ග්‍රහලෝක සූර්යා වටා ඉලිප්සාකාරව ගමන් කිරීම
- ගැලිලියෝ ගැලීලි
  - සඳ මත ආවාට ඇති බව සොයා ගැනීම
  - බ්‍රහස්පති ග්‍රහයාට උපග්‍රහයන් ඇති බව සොයා ගැනීම
- අයිසැක් නිව්ටන්
  - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම

*(ලකුණු 2 × 2 = 04යි)*

**(iii)**

- ලෞකිකත්වයට හා ස්වභාවිකත්වයට නැඹුරු නිර්මාණ බිහි වීම
- පුද්ගලයාගේ නමින් කලා කෘති එළි දැක්වීම
- කලාකරුවන්ට ස්වාධීනව නිර්මාණ ඉදිරිපත් කිරීමට හැකි වීම
- ආගමික මුහුණුවරින් බැහැර වූ නිර්මාණ බිහි වීම
- චිත්‍ර හා මූර්තිවල නිරුවත් හා අඩනිරුවත් රූප නිර්මාණය වීම

- කිරිගරුඬින් ප්‍රතිමා නිර්මාණය කිරීම
- රෝම ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාසය ලබා ගැනීම
- සුඛෝපභෝගී මන්දිර තැනීම
- ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ රූප නිර්මාණය කිරීම

*(ලකුණු 2 + 3 = 05යි)*

**(iv)**

<u>දේශපාලන වෙනස්වීම්</u>

- ජාතික රාජ්‍ය බිහි වීම
- රජුවටා බලය කේන්ද්‍රගත වීම
- මධ්‍යම පන්තිය බිහි වීම
- වංශාධිපතිවරුන්ගේ බලය අඩු වීම
- මධ්‍යම පන්තිය පාලන කටයුතුවලට සහය වීම

<u>ආර්ථික වෙනස්වීම්</u>


- වැඩවසම් ආර්ථික රටාව බිඳ වැටීම
- වෙළෙඳාමේ දියුණුව
- වෙළෙදාම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති හා බදු ප්‍රතිපත්ති හඳුන්වාදීම හා ක්‍රියාත්මක කරවීම
- මුදල් භාවිතය පුළුල් වීම
- බැංකු කටයුතු ආරම්භ වීම
- නව වෙළෙඳ මාර්ග ඔස්සේ පෙර අපර දිග සෘජු වෙළෙඳ සම්බන්ධතා ඇති වීම
  (එක් දේශපාලන වෙනස් වීමක් සහ ආර්ථික වෙනස් වීමක් පිළිතුරට ඇතුළත් විය යුතුය.)

*(ලකුණු 3 + 3 =06 යි)*

### 3.3.16 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය** 3.18

ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




ප්‍රශ්න අංක 8 සඳහා ලකුණු 18ක් හිමි වේ.

ලකුණු 0 - 4 ප්‍රාන්තරයේ 28% ක් ද,

ලකුණු 5 -9 ප්‍රාන්තරයේ 24 % ක් ද,

ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 20% ක් ද,


ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 27% ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 47% ක් ලකුණු 10 හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගෙන තිබේ.

**මූලාශ්‍රය :** RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024 ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.19**

ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

8 ප්‍රශ්නය 10 ශ්‍රේණියේ ‘පුනරුදය’ යන පාඩමෙන් සකසා ඇත. අටවන ප්‍රශ්නය අනුකොටස් හතරකින් සමන්විතය. මෙම ප්‍රශ්නයේ පහසුතාව වැඩිම ප්‍රශ්න අනුකොටස වන්නේ, 8.i.(යුරෝපයේ පුනරුද සමයේ විශ්වය පිළිබඳව නව මත ඉදිරිපත් කර තැනැත්තන් තිදෙනෙකු නම් කරන්න.) වේ. මෙම ප්‍රශ්න අනුකොටසෙහි පහසුතාව 74%කි. මෙම ප්‍රශ්න අනුකොටස හා සම්බන්ධ පුද්ගල නාමයන් සාමාන්‍ය දැනීම හා සම්බන්ධ වීමත් වෙනත් විෂයන්වලදී සාකච්ඡා කිරීමත් වැනි කරුණු මෙම ප්‍රශ්නයෙ හි ඉහළ සාධනයට හේතු වන්නට ඇතැයි සිතිය හැකිය.

මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු ම ප්‍රශ්න අනුකොටස වන්නේ 8.iv (පුනරුදයේ ප්‍රතිඵල ලෙස යුරෝපයේ ඇති වූ දේශපාලන හා ආර්ථික වෙනස්වීම් තුනක් පැහැදිලි කරන්න)වේ. මෙම අනුකොටසෙහි පහසුතාව 38%කි. පුනරුදයේ දේශපාලන හා ආර්ථික වශයෙන් ඇති වූ ප්‍රතිඵලයන් පිළිබඳව අපේක්ෂකයා තුළ නිරවුල් හා පැහැදිලි අවබෝධයක් නොතිබීමත් යම් කරුණක් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු දැක්වීමට ඇති දුර්වලතාවයත් අඩු පහසුතා අගයට හේතු විය හැකිය.

ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී දේශපාලන හා ආර්ථික ප්‍රතිඵල වෙන වෙනම වගුගත කරමින් එම කරුණු පැහැදිලිව ඉස්මතු වන අයුරින් සකස් කර ඉගැන්වීම මගින් මෙම දුර්වලතාවය මගහරවා ගත හැකිය.

### 3.3.17 ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර

9. (i) පළමුවන ලෝක යුද්ධයේ දී ජයගත් පිලට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පළමුවන ලෝක සංග්‍රාමය ඇතිවීමට ජර්මනියේ ක්‍රියාකලාපය හේතු වූ බවට කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) පළමුවන ලෝක සංග්‍රාමයෙන් මිත්‍ර පිල ජයගැනීමට මුල් වූ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)** අමෙරිකා එක්සත් ජනපදය / බ්‍රිතාන්‍යය / ප්‍රංශය / ඉතාලිය / රුසියාව / ග්‍රීසිය / සර්බියාව / රුමේනියාව

*(ලකුණු 1 × 3 = 03යි)*

**(ii)**

- ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේදී ජර්මනිය හා ප්‍රංශය සතුරන් බවට පත් වීම
- ප්‍රංශය හුදෙකලා කිරීමේ බිස්මාර්ක්ගේ ක්‍රියා කලාපය
- ජර්මන් අධිරාජ්‍යයත් පිහිටුවීම සඳහා දෙවන විලියම් රජු අනුගමනය කළ ක්‍රියා කලාපය
- අවිකරණය හා ජාතිවාදය වර්ධනය සඳහා ජර්මනියේ ක්‍රියා කලාපය
- කාර්මික දියුණුවත් සමග ජර්මනිය යටත් විජිත ඇති කර ගැනීමේ තරඟයට එකතු වීම

*(ලකුණු 2 × 2 = 04යි)*

**(iii)**

- අමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පිළට එකතු වීම
- මධ්‍යම බලවතුන්ගේ පිළේ සිටි ඉතාලිය මිත්‍ර පිළට එකතු වීම
- ජර්මනිය තුළ ඇති වූ අර්බුධකාරී තත්ත්වය
- මිත්‍ර පිලේ ප්‍රහාරයන් නිසා ජර්මනියේ යුධ බලය දුර්වල වීම
- ජර්මන් අධිරාජ්‍යයා බලය අත්හැරීම

*(ලකුණු 2 + 3 = 05යි)*

**(iv)**


- අමෙරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබා නොගැනීම
- රුසියාව ජාතීන්ගේ සංගමයට බඳවා නොගැනීම
- ජාතීන්ගේ සංගමය ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට හමුදා බලයක් නොතිබීම
- සංගමයේ තීරණ ක්‍රියාත්මක කිරීමට සාමාජිකයින් පොළඹවා ගැනීමට අසමත් වීම
- ඇතැම් බලවත් රාජ්‍යයන් ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම
- ලෝක සාමය කඩකළ අවස්ථාවලදී එම රටවලට විරුද්ධව කටයුතු කිරීමට සංගමය අපොහොසත් වීම.

*(ලකුණු 3 + 3 = 06 යි)*

### 3.3.18 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය** 3.20

ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





ප්‍රශ්න අංක 9 සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 18 කි. ඉන්,

ලකුණු 0 - 4 ප්‍රාන්තරයේ 38% ක් ද,
ලකුණු 5 - 9 ප්‍රාන්තරයේ 22 % ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 16% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 25% ක් ද,
අපේක්ෂකයන්ගෙන් 41% ක් ලකුණු 10 හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගෙන ඇත.

මූලාශ්‍රය : RD/16/3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.21**

ප්‍රශ්න අංක 9 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

9 ප්‍රශ්නය 11 ශ්‍රේණිය 'ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන්' යන පාඩමෙන් සකසා ඇත. නවවන ප්‍රශ්නය අනුකොටස් හතරකින් සමන්විතය. මෙම ප්‍රශ්නයේ වැඩිම පහසුතාව සහිත ප්‍රශ්න අනුකොටස වන්නේ, 9.i(පළමුවන ලෝක යුද්ධයේදී ජයගත් පිළට අයත් රටවල් තුනක් නම් කරන්න.)වේ. මෙම අනුකොටසෙහි පහසුතාව 79%කි. මෙම ප්‍රශ්නය සඳහා වන පිළිතුරට අදාළ රටවල් ලෝක යුද්ධ දෙකෙහිම ජයගත් පිළට අයත් රටවල් වීම හා ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය ආදී රටවල් පිළිබඳව ලෝක යුද්ධවල දී වැඩි අවධානයකින් සාකච්ඡාවට බඳුන් වීම ඉහළ සාධනයට හේතු වන්නට ඇත.

පහසුතාව අඩු ම ප්‍රශ්න අනුකොටස වන්නේ, 9 iv(ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න.) වේ. මෙහි පහසුතාව 38%කි. ජාතීන්ගේ සංගමය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය යනුවෙන් සංවිධාන දෙකක් පැවතීම නිසා අපේක්ෂකයන් එම සංවිධාන දෙකෙහි සම විෂමතාවන් වෙන් වෙන්ව හඳුනාගෙන මතකයේ තබා ගැනීමට අපොහොසත් වීම අඩු පහසුතාවට හේතු වන්නට ඇත.